# බස්නාහිර පළාතේ පළාත් සභාව
# மேல் மாகாண மாகாண சபை
WESTERN PROVINCE PROVINCIAL COUNCIL

**2013 මාර්තු 19 වන අඟහරුවාදා**
2013 மார்ச் 19 செவ்வாய்க்கிழமை
Tuesday 19th March 2013

**බත්තරමුල්ල, ශ්‍රී ජයවර්ධනපුර, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවතේ, අංක 204 හි පිහිටි බස්නාහිර පළාත් සභා නව ගොඩනැගිලි සංකීර්ණයේ නව සභා ශාලාවේදී පැවති සභා රැස්වීම**

பத்தரமுல்ல, ஸ்ரீ ஜயவர்த்தனபுர, டென்சில் கொப்பேகடுவ மாவத்தை, இல.204 இல் மேல் மாகாண சபையின் புதிய கட்டடத் தொகுதியில் அமைந்துள்ள புதிய சபை மண்டபத்தில் நடைபெற்ற கூட்டம்.

The meeting held at the Western Provincial Council new building complex at No.204, Denzil Kobbekaduwa Mawatha, Sri Jayawardhanapura, Battaramulla.

**පූ.භා. 09.41 පළාත් සභාව රැස් විය.**
*மு.ப.09.41 க்கு சபை கூடியது*
*The Provincial Council met at 09.41 a.m.*

**ගරු සභාපතිතුමා [ සුනිල් විජේරත්න මහතා ] මූලාසනාරූඪ විය.**
*திரு. தவிசாளர் [ சுனில் விஜேரத்ன அவர்கள் ] தலைமை வகித்தார்.*
*Mr. Chairman [ Sunil Wijerathne ] in the Chair*

# නිවේදනය
ANNOUNCEMENT

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

*"ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව, විවාහ ලියාපදිංචි කිරීමේ (සංශෝධන) පනත් කෙටුම්පත, උඩරට විවාහ හා දික්කසාද (සංශෝධන) පනත් කෙටුම්පත. මුස්ලිම් විවාහ හා දික්කසාද (සංශෝධන) පනත් කෙටුම්පත ගරු අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා විසින් 2013 මාර්තු මස 08 වැනි දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනු ලදුව, 46 අ (2) (අ) වන පාර්ලිමේන්තු ස්ථාවර නියෝගය යටතේ වාර්තා කිරීම සඳහා එක් එක් පළාත් සභාවට යොමු කිරීමට විධාන කරන ලද යථෝක්ත පනත් කෙටුම්පත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154  උ 5 (අ) වන ව්‍යවස්ථාව යටතේ මෙම පළාත් සභාවේ අදහස් ප්‍රකාශ කිරීම සඳහා එවනු ලබන බව, පාර්ලිමේන්තුවේ මහ ලේකම්වරයා විසින් අංක Bills/244/245/246 හා 2013 මාර්තු මස 11 වන දාතමින් යුතු ලිපිය මගින් මෙම පළාත් සභාවේ ලේකම්වරයා වෙත දැනුම් දී ඇති බව කාරුණිකව දැනුම් දෙනවා.*

*එමෙන්ම එම පනත් කෙටුම්පත් තුන පිළිබඳව මෙම පළාත් සභාවේ අදහස් 2013 අප්‍රේල් මස 11 වන දින හෝ ඊට පෙර පාර්ලිමේන්තුවේ මහ ලේකම්වරයා වෙත ලැබෙන්නට සැලැස්වීමේ අවශ්‍යතාවය ද එම ලිපිය මගින් පෙන්වා දී ඇති බවත් කාරුණිකව දැනුම් දෙනවා.*

*සභා රීති ප්‍රකාරව එම පනත් කෙටුම්පත් තුන ප්‍රඥප්ති හා නීති කාරක සභාවට යොමු කර එම කාරක සභාවේ වාර්තාව ගැන සභාවේ අදහස් සලකා බැලීමෙන් පසුව පනත් කෙටුම්පත් තුන පිළිබඳව සභාවේ අදහස් පාර්ලිමේන්තුව වෙත දන්වා යැවිය යුතු බවත් ගරු මන්ත්‍රීවරුන්ගේ අවධානයට යොමු කරනවා.*

*එම නිසා ප්‍රඥප්ති හා නීති කාරක සභාවට එම පනත් කෙටුම්පත් තුන යොමු කරනවා. අදාළ වාර්තාව සමඟ ඉදිරි සභා රැස්වීම් න්‍යාය පත්‍රයට එය ඇතුළත් කිරීමට බලාපොරොත්තු වන* බවත් කාරුණිකව දැනුම් දෙනවා.

ලැබී ඇති කෙටි කාල පරාසය තුළ එම කටයුතු නිමා කර ගැනීම සඳහා එලෙස කටයුතු කිරීමට ඔබතුමන්ලාගේ සහයෝගය ලබා දෙනු ඇතැයි මම උදක්ම අපේක්ෂා කරනවා.

# ලිපිලේඛනාදිය පිළිගැන්වීම
PAPERS PRESENTED

**ගරු නිමල් ලාන්සා** (මාර්ග සංවර්ධන, සත්ව නිෂ්පාදන හා සංවර්ධන, නිවාස හා ඉදි කිරීම්, ධීවර හා සංචාරක අමාත්‍යතුමා) [ ගරු ප්‍රධාන අමාත්‍යතුමා වෙනුවෙන්]
Hon. Nimal Lansa - (Minister of Road Development, Animal Production and Development, Housing and Construction, Fisheries and Tourism) [On Behalf of Chief Minister]

ගරු සභාපතිතුමනි, *"ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව විසින් මෙම බස්නාහිර පළාතේ පළාත් සභාවේ අදහස් වාර්තා කිරීම සඳහා යොමු කර ඇති,*

*i. විවාහ ලියාපදිංචි කිරීමේ (සංශෝධන) පනත් කෙටුම්පත*

*ii. උඩරට විවාහ හා දික්කසාද (සංශෝධන) පනත් කෙටුම්පත හා*

*iii. මුස්ලිම් විවාහ හා දික්කසාද (සංශෝධන) පනත් කෙටුම්පත*

*යන කෙටුම්පත් ලේඛන"* මම මෙම සභාවට පිළිගන්වනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මීට පෙර දැනුම් දුන් පරිදි එම පනත් කෙටුම්පත් තුන දැනටමත් ගරු මන්ත්‍රීවරුන්ට ලැබෙන්නට සලස්වා තිබෙනවා.

ඒ පිළිබඳව ප්‍රඥප්ති හා නීති කාරක සභාවේ අදහස් සමඟ නැවත මෙම පළාත් සභාවට ඉදිරිපත් කරනු ලබන බවත්,

ඒ අවස්ථාවේදී ගරු මන්ත්‍රීවරුන්ට ඒ පිළිබඳව වැඩිදුරටත් අදහස් දැක්විය හැකි බවත් කාරුණිකව දැනුම් දෙනවා.

**ගරු මංජු ශ්‍රී අරංගල - විපක්ෂ නායකතුමා**
Hon. Manju Sri Arangala - Leader of the Opposition

ගරු සභාපතිතුමනි, මේ විවාහ නීතිය සම්බන්ධයෙන් -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

නැහැ. ඔබතුමාට අදහස් ඉදිරිපත් කරන්න බැහැ. ඔබතුමා කථා කරන රීතිය මොකක්ද?

**ගරු මංජු ශ්‍රී අරංගල - විපක්ෂ නායකතුමා**
Hon. Manju Sri Arangala - Leader of the Opposition

ප්‍රඥප්ති හා නීති කාරක සභාවේදී මේ පනත් සංශෝධනයක් කරන්න පුළුවන්ද?

**ගරු රේණුක දුෂ්‍යන්ත පෙරේරා - ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක**
Hon. Renuka Dushyantha Perera - Chief Government Whip

අපට සංශෝධන ඉදිරිපත් කරන්න පුළුවන්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

පුළුවන්.

**ගරු ශිරාල් ලක්තිලක**
Hon. Shiral Lakthilaka

බැදිලා නැහැ.

# කාරක සභා වාර්තා
# COMMITTEE REPORTS

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

2013.03.05 වන දින පැවති සභා කටයුතු පිළිබඳ කාරක සභා රැස්වීම් වාර්තාව මම පිළිගන්වනවා.

***අදාළ වාර්තාවේ පිටපත් ගරු මන්ත්‍රීවරුන්ගේ මේසය මත තබා ඇති බව ගරු සභාපතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.***

*The Hon. Chairman declared that a copy of the relevant report is placed on the tables of the Hon. Members.*

# පෙත්සම්
# PETITIONS

**ගරු ගුණසිරි ජයනාත්**
Hon. Gunasiri Jayanath

ගරු සභාපතිතුමනි, කටාන, මීතරවාඩිය, අංක 108/A හි පදිංචි එම්. අයිවන් අප්පුහාමි යන අයගේ පෙත්සම ඉදිරිපත් කරනවා.

**ගරු ආනන්ද රංජිත් රූපසිංහ**
Hon. Ananda Ranjith Rupasinghe

ගරු සභාපතිතුමනි, කළගෙඩිහේන, තිහාරිය, අංක 541 හි පදිංචි බී. මහේෂ් පෙරේරා ගුණරත්න යන අයගේ පෙත්සම ඉදිරිපත් කරනවා.

**ගරු මංජු ශ්‍රී අරංගල - විපක්ෂ නායකතුමා**
Hon. Manju Sri Arangala - Leader of the Opposition

ගරු සභාපතිතුමනි, කිරිවත්තුඩුව, මැදහේන, අංක 375/5 A හි පදිංචි යූ.ජී. තිලකරත්න සහ කිරිවත්තුඩුව, මැදහේන, අංක 375/38 හි පදිංචි ඩබ්ලිව්. ගුණපාල සිල්වා යන අයගේ පෙත්සම ඉදිරිපත් කරනවා.

***[සභා මේසය මත තබන ලද පෙත්සම්]***
*[Petition Tabled]*

සුගත් මතුගමගේ ගරු මන්ත්‍රීතුමාගේ අත්සනින් යුත්,

දොඩංගොඩ, ඔලබොඩ, ශාන්ති උයන, අංක 12 හි පදිංචි කේ.ඒ.ඩී. රංජනී යන අයගේ පෙත්සම සහ

කිත්සිරි කහටපිටිය ගරු මන්ත්‍රීතුමාගේ අත්සනින් යුත්,

ගෝනපල හන්දිය, ඔලබොඩුව, අංක 67 හි පදිංචි ජී.ඩී. දයානන්ද යන අයගේ පෙත්සම.

***ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් කාරක සභාවට යොමු කළ යුතු යැයි නියෝග කරන ලදී.***

*Petitions Presented, ordered to refer to the Petitions committee*

# ප්‍රශ්නවලට වාචික පිළිතුරු
# ORAL ANSWERS TO QUESTIONS

***න්‍යාය පත්‍රයේ අංක 01 හා 02 යටතේ නලින්ද ජයතිස්ස ගරු මන්ත්‍රීතුමාගේ නමින් යුත් ප්‍රශ්න ගරු ප්‍රධාන අමාත්‍යතුමාට ඉදිරිපත් කරන ලදුව, එතුමා වෙනුවෙන් නිමල් ලාන්සා ගරු අමාත්‍යතුමා විසින් ඊට සති දෙකක කාලයක් කල් ඉල් බැවින් ප්‍රශ්න ඉදිරි සභාවට යොමු කරන ලෙසට ගරු සභාපතිතුමා විසින් නියෝග කරන ලදී.***

*The question in the name of the Hon. Nalinda Jayathissa, -Member, under item No. 01 and 02 in the agenda was presented to the Hon. Chief Minister and as two weeks time was asked for it by the Hon. Minister, Nimal Lansa on his behalf, Hon. Chairman ordered the question to be referred to the next Council sitting.*

***න්‍යාය පත්‍රයේ අංක 03 යටතේ මංජු ශ්‍රී අරංගල ගරු විපක්ෂ නායකතුමාගේ නමින් යුත් ප්‍රශ්නය ගරු කර්මාන්ත අමාත්‍යතුමාට ඉදිරිපත් කරන ලදුව, ඊට සති දෙකක කාලයක් කල් ඉල් බැවින් ප්‍රශ්නය ඉදිරි සභාවට යොමු කරන ලෙසට ගරු සභාපතිතුමා විසින් නියෝග කරන ලදී.***

*The question in the name of the Hon. .Manju Sri Arangala., under item No. 03 of the agenda, was presented to the Hon. Minister of Industries and as two weeks time was asked for, Hon. Chairman ordered the question to be referred to the next Council sitting.*

# නොපැමිණ සිටීමේ අවසරය
# LEAVE OF ABSENCE

**ගරු රේණුක දුෂ්‍යන්ත පෙරේරා –** ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. Renuka Dushyantha Perera - Chief Government Whip

ගරු සභාපතිතුමනි, නිහාල් ජයවර්ධන ගරු මන්ත්‍රීතුමාට මාස තුනක කාලයක් නොපැමිණ සිටීමට අවසර ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*Question put and agreed to.*

**ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Felician De Silva

ගරු සභාපතිතුමනි, වරප්‍රසාද ප්‍රශ්නයක් තිබෙනවා. ගිය සභා වාරයේදී අපට ලබා දුන්නා, 2012.01.01 දින සිට 2012.12.31 දක්වා පෙත්සම් ඉදිරිපත් කිරීම්වල සම්පිණ්ඩනයක්. මම පෙත්සමක් ඉදිරිත් කර තිබෙනවා, ජා ඇළ, දැලතුර, නිමල් පෙරේරා යන නමින්. ඒකේ නිර්දේශයක් ලබා දී තිබෙනවා, මාස තුනක් ඇතුළත නිර්දේශය ක්‍රියාත්මක කරන්නය කියලා. දැන් මේ සම්බන්ධයෙන් අද වන තෙක් ක්‍රියාත්මක වෙලා නැහැ. මාස තුනක් ඉවරයි. දැන් මෙතැනින් එහාට ගන්නා ක්‍රියාමාර්ගය මොකක්ද කියලා ඔබතුමාගෙන් දැන ගන්න කැමැතියි.

එකේ නිමිත්ත, ප්‍රාදේශීය සභාව සතු ඉඩමක බලහත්කාරයෙන් පදිංචි වීමක් සම්බන්ධවයි. නිර්දේශය දීලා තිබෙනවා, *"රජය සතු ඉඩම් අනවසරයෙන් අත්පත් කර ගැනීම සම්බන්ධයෙන් නීතිමය පියවර ගෙන මාස තුනක් ඇතුළත වාර්තා කරන ලෙස ප්‍රාදේශීය සභාවට දැනුම් දීමට 2012.10.30 දින නිර්දේශ කරන ලදී"* කියලා. එතකොට අද වන තෙක් මේකට කිසිම පියවරක් අරගෙන නැහැ. ඒකයි මගේ ප්‍රශ්නය.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අපි ඒ පිළිබඳව කඩිනම් ලෙස සොයා බලලා අදාළ ප්‍රශ්නය පිළිබඳව ඔබතුමාට කඩිනමින් පිළිතුරක් ලබා දෙන්නම්.

**ගරු උදේන විජේරත්න**
Hon. Udena Wijerathne

ගරු සභාපතිතුමනි, වරප්‍රසාද ප්‍රශ්නයක්. පෙත්සම් ප්‍රශ්නයක්මයි. මගේ පෙත්සමක් ඉදිරිපත් කරලා තිබුණා, දැන් මාස දෙකකට ප්‍රථමයෙන්. ප්‍රාදේශීය සභාවක ඉඩමක අනවසරයෙන් පදිංචි වීමක් ගැන. පෙත්සම තවම ඉදිරිපත් වෙලා නැහැ. කාර්යාලය වෙනස් වුණ නිසා වෙන්නැති. ඒ ගැන සොයලා බලලා ඊළඟ කාරක සභාවටවත් ඉදිරිපත් කරන්න පුළුවන් නම් හොඳයි කියලා මම ඉල්ලීමක් කරනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔව්. ඒක අපි කරනවා.

**ගරු ශිරාල් ලක්තිලක**
Hon. Shiral Lakthilaka

ගරු සභාපතිතුමනි, මීට වසරකට කලින් කාර්ය පටිපාටි රීති කාරක සභාව විසින් සභාවේ වරප්‍රසාද සහ කාර්ය පටිපාටිය පිළිබඳව වාර්තාවක් සකස් කරලා මේ සභාවට යොමු කළා. ඊට පසුව මේ සභාව විසින් එය ජනාධිපති කාර්යාලයට යොමු කළා. අද වන තෙක් එම වාර්තාවට සිදු වූ දෙයක් පිළිබඳව වාර්තා වෙන්නේ නැහැ. කරුණාකරලා මම ඔබතුමාගේ අවධානය යොමු කරවන අතර, ඒ පිළිබඳව හැකි නම් කමිටුවක් පිහිටුවලා මේ පිළිබඳව ක්‍රියා කරන්න කටයුතු කරන්නය කියලා ඉල්ලා සිටිනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා ඉදිරිපත් කළ කාරණය පිළිබඳව මම ළඟදීත් ජනාධිපති ලේකම්ට කථා කළා. ඒ සම්බන්ධව අපට ඉතාමත් කඩිනමින් පිළිතුරක් ලැබේවි.

**ගරු ශිරාල් ලක්තිලක**
Hon. Shiral Lakthilaka

ගරු සභාපතිතුමනි, දැනට වසරක් ගත වෙනවා ඒකට.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔව්. ඒක මම පිළිගන්නවා. මම ඒ ගැන විමසීමක් කළා. කඩිනම්ව අපි ඒ පිළිබඳව ඔබතුමාට පිළිතුරක් ලබා දෙනවා.

# පෞද්ගලික පැහැදිලි කිරීම්
# PERSONAL EXPLANATIONS

**ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Felician De Silva

ගරු සභාපතිතුමනි, ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා මේ අවස්ථාව ලබා දීම පිළිබඳව. අද දිනය සමස්ත කතෝලික ජනතාවට බොහොම වැදගත් දවසක්. අද 266 වන ශුද්ධෝත්තම පියතුමා වතිකානුවේදී අභිෂේක ලබන දවස. අපේ පළාත් සභාවෙනුත් ඒ පිළිබඳව උන් වහන්සේට දීර්ඝායුෂ ප්‍රාර්ථනා කරනවා. නීරෝගී සුවයෙන් සමස්ත කතෝලික සභාව වෙනුවෙන් වැදගත් කාර්යභාරයක් ඉෂ්ට කරන්න එතුමාට අවස්ථාව ලැබේවායි කියලා ප්‍රාර්ථනා කරමින් එතුමන් ගැන වචන කිහිපයක් කථා කරන්න කැමැතියි.

මෙම අති උතුම් ශුද්ධෝත්තම පියතුමාගේ පදවි ප්‍රාප්තියට ශ්‍රී ලංකාව ඉතාම වැදගත් රටක් වුණා. මොකද, අපේ කොළඹ

අගරදගුරු අති උතුම් මැල්කම් රංජිත් කාදිනල් හිමිපාණන් වහන්සේට මේ අවස්ථාවට, ශුද්ධෝත්තම පියතුමා තෝරා පත් කර ගැනීමේ අවස්ථාවට සහභාගී වෙන්න අවස්ථාව ලැබුණා. ඒක මම හිතන්නේ බොහොම කලාතුරකින් ලැබෙන අවස්ථාවක්.

[ ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා ]

ඒ නිසා අද සමස්ත කතෝලික සභාවට ආර්ජන්ටිනාවේ හෝර්වේ මාරියෝ කාදිනල් බර්ගෝලියෝ අගරදගුරු කාදිනල් වහන්සේට නව ශුද්ධෝත්තම පියතුමා වශයෙන් අභිෂේක ලබන්න හැකියාව ලැබුණා. මම හිතන්නේ, මේ වන කොට උන් වහන්සේ පිළිබඳව, උන් වහන්සේගේ චරිතය පිළිබඳව විවිධ ජනමාධ්‍ය වාර්තා කරලා තිබෙනවා. 1936.12.17 වැනිදා උපත ලබලා, 1969 දී පූජකවරයකු හැටියට පත් වෙලා, විශේෂයෙන්ම, ජේසු නිකාය නියෝජනය කරන එතුමා ආර්ජන්ටිනාවේ බුවර්නෝස් අයර්ස් නුවරදී පූජකවරයෙක් හැටියටත්, ඊළඟට 1997 දී සහාය රදගුරු වශයෙනුත්, 1998 දී අගරදගුරු හැටියටත් කටයුතු කරලා, 2001 වර්ෂයේදී කාදිනල් තනතුරට ඔසවනු ලැබුවා. උන් වහන්සේ ඉතාම ජනප්‍රිය කාදිනල්වරයෙක් හැටියටයි ආර්ජන්ටිනාවේ පතළ වුණේ.

විශේෂයෙන්ම විවිධ මාතෘකාවන් සම්බන්ධයෙන් උන් වහන්සේ ඉතාමත් ක්‍රියාශීලීව තීරණ ගත්ත කාදිනල්වරයකු හැටියට ප්‍රචලිතයි. ඒ අතරින් විශේෂයෙන් අපි කියන්න ඕනෑ. අවුරුදු 1300 කට විතර පස්සේ යුරෝපයෙන් බැහැරව, ලතින් ඇමරිකානු රටකින් පත් වුණු ප්‍රථම කාදිනල් පාප් වහන්සේ විධියට තමයි උන් වහන්සේ ඉතිහාස ගත වෙන්නේ. උන් වහන්සේගේ කාල සීමාවේදී බුවර්නෝස් අයර්ස් නගරයේදී ඒ දුප්පත් ජනතාව වෙනුවෙන්, විශේෂයෙන්ම මුඩුක්කු ආශ්‍රිතව ජීවත් වුණු ජනතාව වෙනුවෙන් උන් වහන්සේ කරපු මෙහෙවර, මම හිතන්නේ ඉතාමත්ම අගය කරන්න ඕනෑ මෙහෙවරක්. පසුගිය පාප් නිලවරණයේදීත් උන් වහන්සේ හිටපු 16 වන බෙනඩික් පාප් වහන්සේත් එක්ක බොහොම ළඟින් කටයුතු කළා. ඒ වාගේම උන් වහන්සේත් එක්කම ඒ පාප්වරයට ඔසවන්න සුදුසුකම් තිබුණු පාප් වහන්සේ කෙනෙක් හැටියට තමයි අපට උන්වහන්සේව හඳුන්වන්නට පුළුවන්. ඒ වාගේම උන් වහන්සේගේ කාල සීමාවේදී සම ලිංගික විවාහය නීතිගත කිරීමට එරෙහිව ලතින් ඇමරිකානු කලාපයේ විශේෂයෙන්ම ආර්ජන්ටිනාවේ උන් වහන්සේගේ හඬ අවදි කරලා, ඒ පිළිබඳව ක්‍රියාත්මක වෙලා තිබෙනවා. ඒ වාගේම තමයි බොහොම සරළ ජීවිතයක් ගත කරන පුද්ගලයකු හැටියට තමයි උන් වහන්සේ පිළිබඳව අපට දැන ගන්නට ලැබිලා තිබෙන්නේ. ආර්ජන්ටිනාවේ තිබෙන පොදු ප්‍රවාහන සේවය තමයි උන් වහන්සේගේ ගමන් බිමන් සඳහා යොදා ගත්තේ. උන් වහන්සේගේ ආහාර පාන තමන් වහන්සේ විසින්ම සූදානම් කර ගෙන, ඒ වාගේ බොහොම සරළ දිවි පෙවෙතක් ගත කරපු කාදිනල්වරයකු හැටියට තමයි උන් වහන්සේ ඉතිහාසගත වෙන්නේ. ඒ නිසා විශේෂයෙන්ම අද සමස්ත කතෝලික ජනගහනයෙන් 50% කට ආසන්න සංඛ්‍යාවක් නියෝජනය කරන ලතින් ඇමරිකානු රටකින් මේ පාප් වහන්සේ තෝරා පත් කර ගැනීමට හැකි වීම සමස්ත කතෝලික සභාවම ඉතාමත්ම ආනන්දනීය තත්ත්වයට පත් වන අවස්ථාවක් හැටියට අපි දකිනවා. විශේෂයෙන්ම ගබ්සාව පිළිබඳව, ඒ වාගේම මරණ දඬුවම පිළිබඳව, ඊළඟට නීත්‍යානුකූල විවාහයකින් තොරව මව්වරුන්ට ඉපදෙන දරුවන් පිළිබඳව කතෝලික සභාවේදී යම් යම් මත ගැටීම් ඇති වන වෙලාවේදී උන් වහන්සේගේ අදහස උන් වහන්සේ ඉතා නිර්භයව ප්‍රකාශ කරලා තිබෙනවා. ඒ පිළිබඳව උන් වහන්සේගේ වචනවලින්ම මම සඳහන් කරන්න කැමැතියි. උන් වහන්සේ එක වෙලාවක කියනවා,

*"මේ ශුද්ධ වූ දේශය තුළ සමහර පූජකතුමන්ලා හිතනවා පාරිශුද්ධ විවාහයකින් තොරව උපදින දරුවන් බෞතීස්ම ලැබීමට සුදුසු නැහැයි කියලා. ඒ අසාධාරණය කරන්නේ පල්ලියේ පූජකවාදය පතුරවන පිරිස. ඔවුන් දෙවියන් වහන්සේගේ ජනතාව මෝක්ෂයෙන් දුරු කරනවා. තමන්ගේ දරුවාට අනතුරක් නොකර ඔහුව ලෝකය හමුවට ගෙන එන්නට දහිරිය තිබෙන මේ ආදරණීය දියණියට අපි එකතුව ශක්තිය වෙන්න ඕනෑ. ඇයගේ දරුවා අනිවාර්යයෙන්ම බෞතීස්ම විය යුතුයි."* කියලා

උන් වහන්සේ ඉතාමත්ම නිර්භය ප්‍රකාශයක් ඒ කාදිනල් තනතුර දරණ අතරවාරයේදී ප්‍රකාශ කරලා තිබෙනවා. මේ වචනවලින්ම තේරෙනවා. උන් වහන්සේ මොන තරම් සමාජශීලී, ඒ වාගේම සාමාන්‍ය ජනතාවගේ එදිනෙදා ප්‍රශ්නත් එක්ක ගැටුණු, හැප්පුණු, ඒ වෙනුවෙන් කථා කරපු, පෙනී සිටපු, විශේෂයෙන්ම ආර්ජන්ටිනාවේ පවතින රජය සහ විවිධ රජයන් එක්ක නිතර දෙවේලේ හැල හැප්පීම් ඇති වෙලා මේ ප්‍රශ්න පිළිබඳව කථා කරපු උතුම් ආගමික නායකයෙක් බව. ඒ නිසා අපට විශ්වාසයක් තිබෙනවා. සමස්ත කතෝලික සභාවම ඉදිරි කාලයේදී මේ තිබෙන යම් යම් මතවාදයන්, විශේෂයෙන්ම ගබ්සාව පිළිබඳව, ඒ වාගේම සම ලිංගික විවාහයන් පිළිබඳව මේ දරන මතවාදයන් සම්බන්ධයෙන් සෘජු තීරණ අරගන්න පුළුවන් ශක්තියක් තිබෙන පූජකතුමෙක් හැටියට අපට උන් වහන්සේ හඳුන්වන්න පුළුවන්.

ඉතින් මේ වෙලාවේදී අපි දන්නවා. උන් වහන්සේ අභිෂේක ලබන මේ අවස්ථාවට ශ්‍රී ලංකා රජය නියෝජනය කරන්න මැති ඇමතිවරු ගිහිල්ලා තිබෙනවා. ඒ අවස්ථාවේදී අපිත් මේ බස්නාහිර පළාත් සභාවේත් සුභාශිංසන එතුමාට ප්‍රාර්ථනා කරනවා. ඒ වාගේම බොහෝ කාලයක් මේ කතෝලික සභාව, මේ ලෝකයේ තිබෙන අනෙකුත් සියලු ආගම් එක්ක ඉතාමත්ම ශක්තිමත්ව, මහජනතාවගේ හිත සුව පිණිස කටයුතු කරගෙන යන්නට උන් වහන්සේට දේව වරප්‍රසාදය ලැබේවායි කියලා ප්‍රාර්ථනා කරමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

**ගරු ඒ.එම්. යූසුෆ්**
Hon. A M Yoosuf

ගරු සභාපතිතුමනි, මට අවස්ථාව ලබා දීම පිළිබඳව ගරු ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. මම විශේෂයෙන්ම සඳහන් කරන්නට ඕනෑ. අද සුරාව පිළිබඳව, ඒ වාගේම සූදුව පිළිබඳව

කථිකාවක් තිබෙන කාලයක් තුළ බේරුවල දර්ගා නගර මධ්‍යයේ අද රේස් බයි රේස් මධ්‍යස්ථානයක් ආරම්භ කර තිබෙනවා. අද මතට තිත ගැන කථා කරන යුගයක, මෙවැනි සූදු පොළක් ආරම්භ කළායින් පස්සේ ඒ වන තත්ත්වය මොකක්ද කියලා ඔබතුමාට අපි කියන්න ඕනෑ වෙන්නේ නැහැ. ඒ නිසා ඔබතුමාගේ මාර්ගයෙන් ගරු නීතිය හා සාමය, පළාත් පාලන විෂය භාර අමාත්‍යවරයා හැටියට ප්‍රධාන අමාත්‍යතුමාට මතක් කරනවා, අපේ බේරුවල ප්‍රාදේශීය සභාව පවා මේකට අවසර ලබා දී නැහැ. ප්‍රාදේශීය සභාවෙන් අවසරයක් නැතිව මේක පවත්වාගෙන යන්න දැන් කටයුතු කරලා තිබෙනවා. ඒ වාගේම මුස්ලිම් දේවස්ථානය ඉස්සරහා තිබෙනවා. එතැන ඉඳලා මීටර් 100 ක් වත් නැහැ. අඹගහ හන්දියේ ඥානේස්වර විහාරස්ථානය තිබෙනවා. අවට තවත් පාසල් ගණනාවක් තිබෙනවා. මෙවැනි සිද්ධස්ථාන ගණනාවක් මධ්‍යයේ මේ රේස් බයි රේස් මධ්‍යස්ථානය පවත්වාගෙන යෑමෙන් රටේ තිබෙන ආර්ථික උද්ධමනයත් එක්ක රටේ සොරකම වැඩි වෙන්න පුළුවන්. ඒ වාගේම සමාජ විරෝධී, නීති විරෝධී වැඩ කටයුතු වැඩි වෙන්න පුළුවන්. ඒ නිසා මේ රේස් බයි රේස් එක නිත්‍යානුකූල නොවන ව්‍යාපාරයක් හැටියට අද බේරුවල දර්ගා නගරය මධ්‍යයේ පවත්වාගෙන යන්න හදනවා. විශේෂයෙන් පළාත් පාලන විෂය භාර අමාත්‍යවරයා හැටියට මේ කටයුත්තට මම අවධානය යොමු කරවන්නේ, අවසරයක් නැතිව මේ කටයුතු කර ගෙන යන නිසා.

විශේෂයෙන් බෞද්ධ ජනතාවගේ, ඒ වාගේම මුස්ලිම් ජනතාවගේ විරුද්ධත්වය අද ප්‍රකාශ කරලා තිබෙනවා. මෙවැනි විරුද්ධත්වයක් මධ්‍යයේ මේ රේස් බයි රේස් පවත්වාගෙන යෑමෙන්, ප්‍රදේශයේ සාමයට ප්‍රශ්නයක් ඇති වෙන්න පුළුවන්. ප්‍රදේශයේ ආරක්ෂාවට ප්‍රශ්නයක් ඇති වෙන්න පුළුවන්. යම්කිසි විධියකින් යම් ප්‍රශ්නයක් ඇති වුණා නම් - මේ සඳහා අවසර දුන්නේ කවුද කියන එක අපි ඔබතුමාගේ මාර්ගයෙන් දැන ගන්නට කැමැතියි. මේ සඳහා අවධානය යොමු කරන්න කැමැතියි. අනවසරයෙන්, ප්‍රාදේශීය සභාවේ අනුමැතියකින් තොරව මේවා පවත්වා ගෙන යාමෙන්, ඉදිරි කාලය තුළදී ඒ ප්‍රදේශයේ සාමයට විශාල තර්ජනයක් වෙන්න පුළුවන්. මුස්ලිම් ජනතාවගේ විරුද්ධත්වය ප්‍රකාශ කරලා තියෙනවා. ඒ වාගේම සිංහල ජනතාවගේ විරුද්ධත්වය ප්‍රකාශ කරලා තියෙනවා. ස්වාමීන් වහන්සේලාගේ විරුද්ධත්වය ප්‍රකාශ කරලා තියෙනවා. මෙවැනි තත්ත්වයක් මත මොන බලධාරියෙකුගේ වුවත්, එහෙම නැත්නම් මොන ප්‍රධානියාගේ වුවත් දේශපාලන අධිකාරී බලයද කියලා අපට හිතන්න ඕනෑ වෙනවා. අර ස්ප්‍රීතු කථාව වාගේ දැන් මේක වෙන්නේ. ඊයේ පෙරෙයිදා ගෙනාපු ස්ප්‍රීතු කන්ටේනර් දෙකට වග කියන්න කවුරුත් නැති වුණා වාගේම, මේ මධ්‍යස්ථානයටත්, නැත්නම් මේ ව්‍යාපාරය පවත්වාගෙන යන්න අවසර දුන්නේ කවුද කියන එක පිළිබඳවත් අද ලොකු කුතුහලයක් වෙලා තිබෙනවා.

(බාධා කිරීමක්)

**ගරු ඒ.එම්. යූසුෆ්**
Hon. A M Yoosuf

ගරු සභාපතිතුමනි, ඒ නිසා දේශපාලන අධිකාරී බලය, එහෙම නැත්නම් ඒ අයගේ බල පුළුවන්කාරකම උඩ මේ ව්‍යාපාරය පවත්වාගෙන යනවාද කියන එක ඔබතුමා මාර්ගයෙන් විශේෂයෙන් ගරු ප්‍රධාන අමාත්‍යතුමාට මම යොමු කරනවා, නීතිය හා සාමය ඇති කරන්න වැඩ පිළිවෙළක් ඇති කරන්නය කියලා. බොහොම ස්තුතියි.

**ගරු එම්.එම්.එම්. අම්ජාඩ්**
Hon. M.M.M. Amjad

36 (1) යටතේ කථා කරන්නේ. ඒ.එම්. යූසුෆ් ගරු මන්ත්‍රීතුමා කරපු ප්‍රකාශය මම ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරයෙක් වශයෙන් අනුමත කරනවා. එතුමා -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාගේ වරප්‍රසාද ප්‍රශ්නය කියන්න. ඔබතුමාට අදහස් ප්‍රකාශ කරන්න දෙන්න බැහැ.

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එහෙම කොහොමද කථා කරන්නේ?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

හරි මම බලා ගන්නම්. මූලාසනයේ සභාපතිවරයෙක් ඉන්නවා.

**ගරු එම්.එම්.එම්. අම්ජාඩ්**
Hon. M.M.M. Amjad

මම කථා කරන්නේ ගරු සභාපතිතුමනි, -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

නැහැ. නැහැ. කථා කරන්න දෙන්න බැහැ. ඔබතුමාගේ වරප්‍රසාද ප්‍රශ්නය කියන්න.

**ගරු එම්.එම්.එම්. අම්ජාඩ්**
Hon. M.M.M. Amjad

වරප්‍රසාද ප්‍රශ්නයක්. මගේ නම පාවිච්චි කළා. සිරිකමල් ගරු මන්ත්‍රීතුමා මගේ නම ප්‍රකාශ කළා. මෙතැන වැරදි

වැටහීමක් ඇති වෙනවා. මම ඒ යෝජනාව අනුමත කරන්න හේතුව සිරිකමල් ගරු මන්ත්‍රීතුමා මගේ නම පාවිච්චි කළා. ඒක මට අපහාසයක් වෙනවා. හානියක් වෙනවා. ඒ හානිය වළක්වන්න තමයි මම ඒක අනුමත කළේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, කරුණාකරලා ඔබතුමා වාඩි වෙන්න.

**ගරු එම්.එම්.එම්. අම්ජාඩ්**
Hon. M.M.M. Amjad

මගේ නම පාවිච්චි කළා, සිරිකමල් ගරු මන්ත්‍රීතුමා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

නැහැ. නැහැ. එතුමා ප්‍රකාශ කළේ නැහැ. එතුමා ඔබතුමාගේ නම කිව්වේ නැහැ. මම අහගෙන හිටියේ.

**ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Felician De Silva

යූසුෆ් ගරු මන්ත්‍රීතුමා, ඒ ගැන වචනයක්වත් කථා කළේ නැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කථා කළේ නැහැ. ඔබතුමා ගැන වචනයක්වත් කිව්වේ නැහැ. එක එක්කෙනා කිව්වාට කථා කරන්න දෙන්න බැහැ.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා** - විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

ගරු සභාපතිතුමනි, අපේ සිරිකමල් පිලීෂියන් ද සිල්වා ගරු මන්ත්‍රීතුමාත් දීර්ඝ වශයෙන් නව පාප්තුමාගේ පත් වීම සම්බන්ධව අදහස් ප්‍රකාශ කළා. ඇත්තටම සතුටු වෙනවා. ඇත්තටම ලොව පුරා වෙසෙන බිලියන 1.2 ක කිතුණු බැතිමතුන්ගේ නායකත්වයට පත් වීම සම්බන්ධව අපි සියලු දෙනාම සතුටු වන මොහොතක අද අභිෂේක ලබන අවස්ථාවක ඇත්තටම එදා දවස රෝමයේ වතිකානු නුවර සිස්ටයින් දේවස්ථානයේ පැවති රහසිගත ඡන්දයෙන් ලොව පුරා සිටින කාදිනල්වරු 115 දෙනෙකු අතරින් මේ ආර්ජන්ටිනාවේ ජෝර්ජ් මාරියෝ කාදිනල් හිමිපාණන් - මගේ නමම තිබෙනවා. එම අවස්ථාවට පත් වීම අපි අගය කරන්න ඕනැ. අද එතුමා පළමුවැනි ෆ්‍රැන්සිස් පාප්තුමා නමින්, 266 වැනි පාප්තුමා වශයෙන්. අභිෂේක ලබනවා. අද අපේ ලංකාවට කාදිනල් තනතුරක් තිබෙන නිසා ඒ අවස්ථාවට අපේ ලංකාව නියෝජනය කිරීමට අපේ මැල්කම් රංජිත් කාදිනල් හිමිපාණන්ට අවස්ථාව උදා වුණා. එම රහසිගත ඡන්ද අවස්ථාවටත් සහභාගී වුණා. ඒ වාගේම අද දවසේත් සහභාගී වෙනවා. උන් වහන්සේටත් අපේ ස්තුතිය, ඒ වාගේම සුභාශිංසනය ප්‍රකාශ කරනවා.

අපි නව පාප් වහන්සේ ගැන කථා කරනවා නම්, අපේ සිරිකමල් පිලීෂියන් ද සිල්වා ගරු මන්ත්‍රීතුමා සඳහන් කළ ආකාරයට පූජක දිවියට ඇවිල්ලා, රදගුරු වෙලා, අගරදගුරු වෙලා, කාදිනල් වෙලා අද බිලියන 1.2 ක කතෝලික ජනතාවගේ නායකත්වට පත් වෙලා තිබෙනවා. ඉතින් එවැනි අවස්ථාවක ජනතාව සමඟ ගැටෙන නායකයෙක් වශයෙන්, එදා දවස රෝමයේ ශාන්ත පීතර බැසිලිකා දේවස්ථානය ඉදිරිපිටට දහස් ගණන් ජනතාව රැස් වෙලා ලතින් භාෂාවෙන් කිව්වේ, අපට පාප්තුමෙක් ලැබුණා කියන හඬයි. ඒ සතුට අද ලංකාවේ වෙසෙන අපේ ජනතාවටත් ලැබෙන බව ප්‍රකාශ කරමින්, අපේ පළාත් සභාවේ සියලුම දෙනාගේත්, ඒ වාගේම බස්නාහිර පළාත් සභාවේත් සුභාශිංසනය උන් වහන්සේට ප්‍රකාශ කරමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

**ගරු ලලිත් වනිගරත්න**
Hon. Lalith Wanigarathne

ගරු සභාපතිතුමනි, විශේෂයෙන්ම අලුතෙන් පත් වූ අපේ ගරු පාප් වහන්සේ වෙනුවෙන් සුභ පැතුම් එක් කිරීමට අවස්ථාව ලැබීම ගැන මා සතුටු වෙනවා. ඒ වාගේම අපේ සිරිකමල් පිලීෂියන් ද සිල්වා ගරු මන්ත්‍රීතුමා උන් වහන්සේ පිළිබඳව දීර්ඝ විස්තරයක් අපේ පළාත් සභාවට යොමු කළා. ඒ නිසා මා මේ අවස්ථාවේදී විශේෂයෙන්ම ශ්‍රී ලංකාවේ කතෝලික ජනතාවගේත්, ඒ වාගේම බස්නාහිර පළාතේ ආණ්ඩු පක්ෂයේත්, ඒ වාගේම ගරු ප්‍රධාන අමාත්‍යතුමාගේත්, ගරු අමාත්‍යවරුන්ගේත්, ගරු මන්ත්‍රීවරුන්ගේත් සුභාශිංසනය මේ අවස්ථාවේදී ප්‍රකාශ කරනවා. මම හිතන්නේ කතෝලික ජනතාවට දීර්ඝ කාලයක් සේවය කරන්නට උන් වහන්සේට ශක්තිය, ධෛර්යය ලැබේවායි කියා ප්‍රාර්ථනා කරමින් මම නිහඬ වෙනවා.

## පෞද්ගලික මන්ත්‍රී යෝජනාව :
PRIVATE MEMBERS MOTION:

## අධ්‍යාපනය සඳහා දළ දේශීය නිෂ්පාදිතයෙන් 6% ක් වෙන් කිරීම
ALLOCATING 6% FROM THE GROSS NATIONAL PRODUCT FOR EDUCATION

**ගරු නලින්ද ජයතිස්ස**
Hon. Nalinda Jayathissa

ගරු සභාපතිතුමනි, පහත සඳහන් යෝජනාව මම ඉදිරිපත් කරනවා.

*"අධ්‍යාපන හා උසස් අධ්‍යාපන ක්ෂේත්‍රවල මෑත කාලයේ අර්බුද රැසක් පැන නැගිණ. රටේ ඉහළම බුද්ධිමය සම්පත වන විශ්ව විද්‍යාල ආචාර්ය, මහාචාර්යවරු අඛණ්ඩ වර්ජනයක නිරතව සිටියහ. මෙම අර්බුදයන් රැසකටම මූලික හේතුව අධ්‍යාපනය සඳහා ප්‍රමාණවත් ප්‍රතිපාදන වෙන් නොකිරීමයි. යුනෙස්කෝ*

*සංවිධානය විසින් ඉදිරිපත් කරන ලදුව, ශ්‍රී ලංකාවේ ආණ්ඩු විසින් ද වරින් වර පිළිගනු ලැබූ යෝජනාවක් වන දළ දේශීය නිෂ්පාදිතයෙන් 6% ක් අධ්‍යාපනයට වෙන් කළ යුතු යැයි මෙම බස්නාහිර පළාතේ පළාත් සභාව රජයට යෝජනා කර සිටියි."*

**ගරු යූ. ජෝර් පෙරේරා –** විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

***[විසින් ස්ථිර කරන ලදී.]***
*[Seconded]*

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***
*Question proposed*

[ පූ.භා. 10.06 ]

**ගරු නලින්ද ජයතිස්ස**
Hon. Nalinda Jayathissa

ගරු සභාපතිතුමනි, විශේෂයෙන්ම රටේ අධ්‍යාපන ක්ෂේත්‍රය සම්බන්ධයෙන් පසුගිය වසරක කාලය තුළදී විවිධාකාරයේ සිදුවීම් වාර්තා වුණා. ඒ සිදුවීම්වලදී අධ්‍යාපනයට සහ උසස් අධ්‍යාපනයට සම්බන්ධ බොහෝ පාර්ශවයන් වෙතින් ඉල්ලා සිටියේ අධ්‍යාපනය වෙනුවෙන් වෙන් කර තිබෙන ප්‍රතිපාදන ප්‍රමාණවත් නැතිය. ඒ නිසා ඒ ප්‍රතිපාදන වැඩි කරන්නය කියලා. විශේෂයෙන් ඔබතුමා දන්නවා. පසුගිය අවුරුද්දේ සැප්තැම්බර් මාසයේ, අපේ රටේ ඉතිහාසයේ පළමුවන වතාවට රටේ විශ්ව විද්‍යාල ආචාර්යවරු, අපේ රටේ ඉන්න ඉහළම බුද්ධිමය ප්‍රජාව පාරට බැහැලා මාස තුනක් තිස්සේ උද්ඝෝෂණය කරලා, දවස් පහක් තිස්සේ ගාල්ලේ සිට කොළඹට පා ගමනක් ඇවිල්ලා, ඔවුන් ඉල්ලා හිටපු ප්‍රධානතම ඉල්ලීම බවට පත් වුණේ, අධ්‍යාපනයට 6% ක් වෙන් කරන්නය කියන ඉල්ලීමයි. ඒ වාගේම තමයි විදුහල්පතිවරු සහ ගුරුවරු විටින් විට උද්ඝෝෂණ ක්‍රියාමාර්ග මගින් ආණ්ඩුවට බලපෑම් කර සිටියා, 6% ක් අධ්‍යාපනයට වෙන් කරන්නය කියලා. එතකොට මේ 6% කියන ඉල්ලීම ගරු සභාපතිතුමනි, ඒ විශ්ව විද්‍යාල ආචාර්යවරුන්ගේවත්, ගුරු හෝ විදුහල්පති වෘත්තීය සමිතිවලවත් එහෙම නැත්නම් මේ රටේ දේශපාලන පක්ෂවලවත් ඒ අය අලුතෙන් හදපු ඉල්ලීමක් නොවෙයි. මේ ආණ්ඩුවම 1996 දී යුනෙස්කෝ සංවිධානය ඉදිරියේ පොරොන්දු වෙලා ආවා, අධ්‍යාපනය වෙනුවෙන් 6% ක් වෙන් කරනවාය කියලා. ඒ වාගේම ඒ යුනෙස්කෝ සංවිධානයේදී ආණ්ඩුව පොරොන්දු වෙලා තිබෙනවා, 2015 වන කොට 7% ක් අධ්‍යාපනයට වෙන් කරන්නත්, 2020 වන කොට එය 9% දක්වා වැඩි කරන්නත්. ඒ නිසයි යුනෙස්කෝ සංවිධානයට මෙතැනට යන්න සිද්ධ වුණේ, ඔබතුමා දන්නවා, විශේෂයෙන් 1977/78 ට පස්සේ ලෝකයට විවෘත ආර්ථිකය, එහෙම නැත්නම් නව ලිබරල් ධනවාදය හඳුන්වා දුන්නාම බොහෝ රටවල් අධ්‍යාපනයට වෙන් කරන ප්‍රතිපාදන කප්පාදු කරන්න පටන් ගත්තා. ඒ නිසා සමාජයේ බරපතළ විෂමතාවයක් පැන නැගුනා. ඒ විෂමතාවය අන්ත අසාධාරණ හින්දා රජය මැදිහත් වෙලා අධ්‍යාපනයේ අයිතිය ගත යුතුය. ඒ සඳහා අවම වශයෙන් 6% ක් වත් වෙන් කළ යුතුය කියලා තමයි ගරු සභාපතිතුමනි, යුනෙස්කෝ සංවිධානයේදී අපි එකඟ වුණේ. එහිදී අපේ රටේ ආණ්ඩු කිසිදු පැකිලීමක් දැක්වුවේ නැහැ, ඒකට අත්සන් කරන්න. 1996 දී හිටපු පොදු පෙරමුණ ආණ්ඩුවත් අත්සන් කළා. 2001 - 2003 කාලයේදී ඒකට මේ රටේ හිටපු එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුවත් එකඟ වුණා. ඒ නිසා අත්සන් කළා නම්, ඒක පිළිගත්තා නම්, දැන් ආණ්ඩුව සිදු කළ යුතුව තිබෙන්නේ, දිගින් දිගටම ඒ දක්වා, ඒ වෙතට යන විධියේ ප්‍රතිපාදන වෙන් කරන්නයි. හැබැයි ගරු සභාපතිතුමනි, ඉතාම කනගාටුයි. අපේ රටේ ඉතිහාසයේ නිදහසෙන් පස්සේ ගත වූ අවුරුදු 65 තුළ අඩුම තරමින් අධ්‍යාපන ප්‍රතිපාදන වෙන් කරපු අයවැය තමයි පසුගිය අවුරුද්දේ ඉදිරිපත් කළේ. සමස්ත අධ්‍යාපනයට වෙන් කරලා තිබෙන්නේ, දළ දේශීය නිෂ්පාදනයෙන් 1.49% යි. 1.5% ටත් වඩා අඩුයි. එතකොට 1950 දී මේ රටේ සුද්දාගෙන් නිදහස ගත්තාට පස්සේ 2.5% ක් වෙන් කරලා තිබෙනවා. 1955 දී 2.64% ක් වෙන් කරලා තිබෙනවා. 1960 දී 4.7% ක් වෙන් කරලා තිබෙනවා. 1965 දී 4.4% ක් වෙන් කරලා තිබෙනවා. 1972 දී 5.2% ක් වෙන් කරලා තිබෙනවා. 5.2% ක්. 72 දී. ඕනෑ නම් අපට 6% ට යන්න තිබුණේ - (බාධා කිරීමක්) 72 දී 5.2% ක් වෙන් කළේ ගරු අල්මේදා මන්ත්‍රීතුමා, එහෙම ගහලා ආණ්ඩුවේ ඇස් ඇරුණාට පස්සේ. ඒක මතක තියා ගන්න. 1977 න් පස්සේ දිගින් දිගටම ඒ ප්‍රතිපාදන කප්පාදු වෙන්න පටන් ගත්තා. 2012 දී විශ්ව විද්‍යාල ආචාර්යවරු, ගුරුවරු, විදුහල්පතිවරු, ශිෂ්‍යයෝ, දෙමව්පියෝ පාරට බැහැලා උද්ඝෝෂණය කරද්දී, ඒ වේලාවේ අධ්‍යාපනයට වෙන් කරලා තිබුණේ 1.86% යි. හැබැයි, ඒ උද්ඝෝෂණවලින් පස්සේ ආණ්ඩුව ඒක 1.49% ට කැපුවා. පසුගිය අයවැයේදී ජනාධිපතිතුමා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළා, 4.1% ක් සමස්ත අධ්‍යාපනයට වෙන් කරලා තිබෙනවාය කියලා. අපි සොයලා බැලුවා කෙහෙන්ද මේ 4.1% ආවේ කියලා. ඒ වෙන් කරලා තිබෙන්නේ වෙන කොහෙන්වත් නොවෙයි. අපේ රටේ දෙමව්පියෝ, ව්‍යාපාරිකයෝ, සියලුදෙනා අධ්‍යාපනයට වෙන් කරන මුදලත් අධ්‍යාපනයට දාලා තමයි ඒ ගණන කිව්වේ. එහෙම අයවැය ඉදිරිපත් කරන රටක් ලෝකයේ නැහැ.

ඔබතුමා දන්නවා. සමාන්‍යයෙන් ආරක්ෂක අමාත්‍යාංශයට ප්‍රතිපාදන වෙන් කරනවා. රජයේ සන්නද්ධ හමුදා පවත්වාගෙන යන්න. බුද්ධි අංශය පවත්වාගෙන යන්න. ඒ ආරක්ෂක කටයුතු සඳහා ආරක්ෂක අමාත්‍යාංශයට නිශ්චිත මුදලක් වෙන් වෙනවා. හැබැයි ඊට සමගාමීව – මොකද, රජය හැමෝම ආරක්ෂා කරන්නේ නැති හින්දා ගෙදර බල්ලව, එහෙම නැත්නම් මුරකාරයෙක් දාන්න පුද්ගලිකවත් ආරක්ෂාව වෙනුවෙන් එක එක්කෙනා වියදම් කරනවා. ඒවා අයවැයට ඉදිරිපත් කරන්නේ නැහැ. මේ පසුගිය අයවැය ඉදිරිපත් කළේ එහෙම. සාමාන්‍ය බාහිර පන්ති ගාස්තුවලට ගණන කිව්වා. අධ්‍යාපන ප්‍රකාශන පොත්පත්වලට ගණන කිව්වා. ප්‍රවාහන වියදම්. ඒ කියන්නේ School Van එකට, බස් වියදම්වලට යන ගණන කිව්වා. ජාත්‍යන්තර පාසල්වලට යන ගණන කිව්වා. පෞද්ගලික උසස් අධ්‍යාපනවලට යන ගණන කිව්වා. ඒ ඔක්කෝම කියලා තමයි 4.1% ක් වෙන් කළේ. දැන් ඔබතුමා කල්පනා කරලා බලන්න. අධ්‍යාපන ප්‍රතිපාදන එන්න

එන්න කප්පාදු කරනකොට විශේෂයෙන් මේ පාසල් 9662 පවත්වාගෙන යන්න, ඒ බර දෙමව්පියන් මත පැටවිලා තිබෙනවා. ඒ බර කොහොම හරි කරගහගෙන යන්න ඕනෑ දෙමව්පියෝ. මේ රටේ දෙමව්පියෝ තමන්ගේ දරුවන්ට උගන්වන්න, තමන්ගේ දරුවන්ට අධ්‍යාපන ඉනිමගේ ඉහළට යන්න ඒක ඉනිමගක් කරගෙන -

**ගරු උපාලි කොඩිකාර** (ප්‍රවාහන, ක්‍රීඩා හා තරුණ කටයුතු, සංස්කෘතික හා කලා කටයුතු, සමුපකාර සංවර්ධන, ආහාර සැපයීම් හා බෙදා හැරීම් කටයුතු සහ ග්‍රාම සංවර්ධන අමාත්‍යතුමා)
Hon. Upali Kodikara (Minister of Transport, Sports and Youth Affairs, Cultural and Arts Affairs, Cooperative Development, Food Supplies and Distribution and Rural Development)

දෙමව්පියන්ගේ දරුවෝ මැරුවේ ඔබතුමන්ලා නේ?

**ගරු නලින්ද ජයතිස්ස**
Hon. Nalinda Jayathissa

ඔව් ඉතින් 6% ක් නොවෙයි. 60% ක් -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු ඇමැතිතුමා -

**ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Felician De Silva

ඇමැතිවරුන්ට උගන්වන්න 60% ක් වෙන් කරන්න ඕනෑ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

උපාලි කොඩිකාර ගරු ඇමැතිතුමා -

**ගරු නලින්ද ජයතිස්ස**
Hon. Nalinda Jayathissa

60% ක් වෙන් කළත්, 600% ක් වෙන් කළත් මේ වාගේ කට්ටියව නම් කොහොමටවත් හදන්න බැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු ඇමැතිතුමා, ඔබතුමා නිශ්ශබ්ද වන්න. අනවශ්‍ය ගැටුම්වලට යන්න එපා. වාඩි වෙන්න. බාධා කිරීම් කරන්න දෙන්න බැහැ. කරුණාකරලා වාඩි වෙන්න. බාධා කිරීම් කරන්න එපා. ඔබතුමා ඇමැතිවරයෙක්.

**ගරු නලින්ද ජයතිස්ස**
Hon. Nalinda Jayathissa

ගරු සභාපතිතුමනි, රටේ පාසල් ලක්ෂ ගණනක් වැඩි කළත් මේ වාගේ කට්ටිය හදන්න බැරි වෙයි. ඒ නිසා අධ්‍යාපනයට වෙන් කළ ප්‍රතිපාදන කප්පාදු කිරීමේ ප්‍රතිඵලය තමයි ඒ බර දෙමව්පියන් මත පැටවීම. ඒ නිසා තමයි පසුගිය මාර්තු මාසයේ පස්වැනිදා රටේ ප්‍රධාන පුවත්පත්වල වාර්තා වෙනවා. හම්බන්තොට දිස්ත්‍රික්කයේ හුංගම විජයබා ජාතික පාසලට තමන්ගේ දරුවා ඇතුළත් කරන්න රුපියල් 4000/- ක් දෙන්න, තමන්ව ජීවත් කරවපු ඔරුව රුපියල් 10,000/- කට විකුණලා එයින් රුපියල් 4000/- ක් පාසලට දෙන්න ඒ තාත්තාට සිද්ධ වුණා. එතැනින් එහාට එයාගේ ජීවිකාව පවත්වාගෙන යන්න ඔරුවක් නැහැ. මේ වෙන කොහෙවත් නොවෙයි. අපේ බස්නාහිර පළාතෙන් පිට තමයි. හැබැයි අර මත්තල ගුවන් තොටුපල හැදෙන හම්බන්තොට දිස්ත්‍රික්කයේ රුපියල් 4000 ක් සොයා ගන්න තාත්තා කෙනෙක් ඔරුවක් විකුණනවා. ඒ විතරක් නොවෙයි. පළාත් සභාවේදීත් අපි කථා කළා. පොල් ගෙඩි අටක් විකුණලා දරුවෙක් තමන්ගේ පාසලට රුපියල් 800/- ක් ගෙවීම සම්බන්ධව මහත් ආන්දෝලනාත්මක සිදුවීමක් සිද්ධ වුණා. මෙවැනි සිදුවීම් ගණනාවක් වාර්තා වන තත්ත්වයක් ඇතුළේ දැන් ඒකෙන් පෙන්නුම් කරන්නේ මොකක්ද? ආණ්ඩුව එන්න එන්න ප්‍රතිපාදන කප්පාදු කරනකොට ඒ බර දෙමව්පියෝ මත පැටවෙනවා. අපි කොපමණ කිව්වත්, දැන් ආණ්ඩුව කියයි චක්‍රලේඛ ගැහුවා, මුදල් එකතු නොකරන්න කියලා. හැබැයි, මුදල් එකතු නොකරන්න නොවෙයි චක්‍රලේඛ ගැහුවේ. මුදල් එකතු කිරීම විධිමත් කරන්න. දැන් විධිමත් කිරීමේ චක්‍රලේඛ ගහලා තිබෙන්නේ. ඒක නිසා තමයි ගරු මහ ඇමැතිතුමා කිව්වේ, දැන් පළාත් සභාවල තීන්දුවක් ගන්න ඕනෑය කියලා. මුදල් එකතු කිරීම විධිමත් කිරීමට චක්‍රලේඛ ගහන්න. පසුගිය දවස්වල චක්‍රලේඛයක් ගැහුවා. හැබැයි ඒ චක්‍රලේඛයෙන් කළෙත් මොකක්ද? මුදල් එකතු කිරීම විධිමත් කිරීම. ආණ්ඩුව 2008/35 කියන චක්‍රලේඛය ගහලා අවසර දීලා තිබෙන්නේ, පාසල්වල දෙමව්පියන්ගෙන් මුදල් එකතු කරන්න.

ඒ නිසා තමයි විදුහල්පතිවරු බය නැතිව සල්ලි එකතු කරන්නේ. ගුරුවරු පන්ති කවය තියලා කියන්නේ සල්ලි දෙන්න කියලා. තීන්ත ගාන්න, උළු කැටේට, අරකට මේකට සල්ලි ගේන්න කියලා. මෙහෙම කිව්වාට පස්සේ ගරු සභාපතිතුමනි, තමුන්නාන්සේත් දන්නවා. අපේ රටේ පාසල් පද්ධතියේ බරපතළ විෂමතාවයක් තිබෙනවා. සමහර පාසල්වල දුරකථන බිල රුපියල් ලක්ෂ 01 1/2 ක් විතර වෙනවා. සමහර පාසල්වලට සම්පූර්ණ නඩත්තුවට, සමහරවිට මුළු ඉස්කොලේම තීන්ත ගා ගන්න පුළුවන් එවැනි මුදලක් දුන්නොත් එහෙම. මේ ගණන දෙමව්පියන්ගෙන් එකතු කරන්නට ගත්තාට පස්සේ මෙන්න මේ විෂමතාවය වැඩි වෙනවා. ඇති හැකි දෙමව්පියෝ යෝජනා කරයි. හැබැයි තමන්ගේ දරුවාට තිබෙන ආදරයට, තමන්ගේ දරුවා පන්තියේදී හැල්ලු වෙයි. කොන් වෙයි. පැත්තකට වෙයි කියන ඒ අදහස හින්දා කණකර හරි උකස් තියලා දෙමව්පියෝ මේ මුදල පාසලට යවනවා. ඒ නිසා තමයි මේක දෙමව්පියෝ නිහඬව විඳ දරාගෙන සිටියේ. හැබැයි, ආණ්ඩුවේ වගකීම ඒක නොවෙයි. ඒ නිසා අවම වශයෙන් 6% ක් වෙන් කළ යුතුයි කියන මේ ඉල්ලීම එන්නේ වෙන කුමක් හෝ සඳහා නොවෙයි. අධ්‍යාපන අයිතිය රජය සතු කරගන්න ඕනෑ. එහෙම නැත්නම් තව ටික කාලයක් ගියාට පස්සේ දැන් යුරෝපා රටවල වෙනවා වාගේ, ලෝකයේ සමහර රටවල වෙනවා වාගේ උසස් අධ්‍යාපනය ලබා ගන්න, ද්විතීයික පාසල්වලට ඇතුල් වෙන්න ගණිකා වෘත්තියේ

යෙදන දරුවෝ මේ රටේ ඇති වෙන්න ඉඩ තිබෙනවා. ආණ්ඩුව හදන්න යන්නේ සංචාරක ව්‍යාපාරය නම්, එතැන නම් රැකියා අවස්ථා උත්පාදනය වෙන්නේ. එතැනට රට තල්ලු වෙන්න පුළුවන් ගරු සභාපතිතුමනි. ඒක මහා බරපතළ ඛේදවාචකයක්. ඒ නිසා අපි සියලුදෙනා එකතු වෙලා මම මේ යෝජනාව ඉදිරිපත් කරමින් ඉල්ලන්නේ, මම හිතනවා ආණ්ඩු පක්‍ෂය පළමුවෙන්ම මේ 6% යේ යෝජනාවට එකඟ වෙයි කියලා. අධ්‍යාපනයට 6% ක් කියන එක නයාට අඳු කොළ වාගේ ගන්න එපා. මේ යෝජනාවට එකඟ වෙන්න. එකඟ වෙනවා විතරක් නොවෙයි. ඒ සඳහා යන පාරට, අපි ආණ්ඩුවට යෝජනා කරමු. මෙන්න මේ ගණන වෙන් කරන්න කියලා. ඒ නිසා මේ යෝජනාව, අපි රටේ නිදහස් අධ්‍යාපනය වෙනුවෙන් පළාත් සභාවෙන් සත්භාවයෙන් ඉදිරිපත් කරන හොඳ යෝජනාවක් කියලා හිතලා, සලකලා මේ වෙනුවෙන් උදව් කරන්න, ආධාර කරන්න කියලා කියමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

**ගරු උපාලි කොඩිකාර –** අමාත්‍යතුමා
Hon. Upali Kodikara - Minister

ගරු සභාපතිතුමනි, හැන්සාඩ් එකෙන් වචනයක් අයින් කරන්න කියලා මම ඉල්ලා සිටිනවා. මේ පාසල් යන සමස්ත දූ දරුවන් වෙනුවෙන්. ගණිකා වෘත්තියේ යෙදෙනවා කියලා මෙතුමා කිව්වා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

නැහැ. නැහැ. එතුමා එහෙම අදහස් ප්‍රකාශ කළේ නැහැ.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

බොරු කියන්න එපා.

**ගරු උපාලි කොඩිකාර –** අමාත්‍යතුමා
Hon. Upali Kodikara - Minister

පොඩ්ඩක් අහගන්න. හැන්සාඩ් එක දාලා බලමු කෝ? කෑ ගහන්න දෙයක් නැහැ. ටේප් එක දාලා බලන්න පුළුවන්.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

බොරු කියන්නේ නැතිව ඉඳගන්න.

[සභාවේ ඝෝෂා]

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු ඇමැතිතුමා වාඩි වෙන්න. ලංකාවේ ළමයින් ගැන එතුමා කිව්වේ නැහැ. නෙලුක් මල්ලව ගරු මන්ත්‍රීතුමා ඔබතුමාට විනාඩි 05 ක කාලයක් තිබෙනවා.

**ගරු නෙ ක් මල්ලව**
Hon. Neluk Mallawa

ගරු සභාපතිතුමනි, කාලය කොච්චරද?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

විනාඩි 05 යි ඔබතුමාට තිබෙන්නේ. ගරු සංවිධායකතුමා කථිකයෝ හය දෙනෙක් ඉන්නවා. විනාඩි 40 යි තිබෙන්නේ.

**ගරු රේණුක දුෂ්‍යන්ත පෙරේරා –** ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. Renuka Dushyantha Perera - Chief Government Whip

මගෙන් 05 ක් දෙන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එතකොට ඔබතුමාට කාලයක් නැහැ. ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට විනාඩි 10 ක කාලයක් තිබෙනවා.

[ පූ.භා. 10.18 ]

**ගරු නෙ ක් මල්ලව**
Hon. Neluk Mallawa

ගරු සභාපතිතුමනි, නලින්ද ජයතිස්ස ගරු මන්ත්‍රීතුමා, ඉදිරිපත් කරන ලද මේ යෝජනාව සම්බන්ධයෙන්, බොහෝ වේලාවට මේ 6% සංඛ්‍යාව මා විශ්වාස කරනවා. මේක එතුමන්ලා විසින් කාලයක් තිස්සේ රැගෙන ආපු එක්තරා දේශපාලන ප්‍රකාශයක්. මේක ඊට එහා දෙයක් නොවෙන්නේ. මේ 6% කියන එක නිකන් ආගමක්, ප්‍රතිපත්තියක් වාගේම අරගෙන 6% තුළ මේ සියලු දේ සාක්ෂාත් වෙනවා කියලා හිතනවා නම් මම හිතන්නේ, ඒ දේශපාලන දැක්ම පිළිබඳව දෙතුන් වතාවක්ම එතුමා විසින් සිතා බැලිය යුතුයි. එයට හේතුව ගරු සභාපතිතුමනි, මේවා හුදු දේශපාලන ප්‍රයෝග පමණයි. පසුගිය කාලයේ විශ්ව විද්‍යාල ආචාර්යවරු තමුන්ගේ වැටුප වැඩි කරගන්න මූලික ජනතාවාදී සටන් පාඨයක් ඉදිරිපත් කළා, ජනතාවට දැනෙන විධියට. එදා දවසේ ජනතා විමුක්ති පෙරමුණ මූලික කරගෙන, සියලුදෙනා මූලික කරගෙන පා ගමන් ඇවිල්ලා, විරෝධතා දක්වමින් ඔවුන් මේ 6% යේ සටන් පාඨය දැම්මේ ගරු සභාපතිතුමනි, ජනතාව ඉදිරියේ තමන්ගේ සටන් පාඨය මානවවාදී කරන්න. හැබැයි, වැටුප් ප්‍රශ්නය හරි ගිය ගමන් විශ්ව විද්‍යාල සේවයට ගියා. විශ්ව විද්‍යාල සේවයට ගිහිල්ලා හිඟ වැටුප් සමඟ සේවය නොකරපු මාස තුනටත් වැටුප් අරගෙනයි ඒ ගොල්ලෝ නැවත රස්සාවේ වාඩි වුණේ. එතකොට වර්ජනය කළ කාලසීමාවටත් මේ 6% න් තමයි පඩි ගෙවන්න කියලා ගරු සභාපතිතුමනි, ඔවුන් කියන්නේ. හැබැයි, ඒ විතරක් නොවෙයි. මේ විශ්ව විද්‍යාල ආචාර්යවරුන්ගේ සටන මෙහෙයවපු ශිෂ්‍ය නායකයෝ, ඒ ශිෂ්‍ය ව්‍යාපාරය, ශිෂ්‍යයෝ වර්ජනය කරලා ඉන්න කාලසීමාවේදි මහපොළ කපා හැරියාම, මහපොළ ලබා දෙන්න කියලා නම් සටන් කරලා නැහැ. ඒ නිසා මෙන්න මෙතැන්දි අපි යම් යම් දේවල් පිළිබඳව – අද දවසේදී සහශ්‍ර සංවර්ධන අභිමතාර්ථ සාක්ෂාත් කර ගැනීම වෙනුවෙන්, ඒ සහශ්‍ර සංවර්ධන අභිමතාර්ථ සාක්ෂාත් කර ගන්න යුනෙස්කෝව ඉදිරිපත් කරනවා එක්තරා නිර්ණායක ප්‍රමාණයක්. ඒ නිර්ණායක

ප්‍රමාණය තමයි, මේ 6% සීමාව කියලා කියන්නේ. අපි එයට එකඟ වෙනවා. එකඟ වෙනතේ ලෝක සම්මතය තුළ. ලෝකයේ අධ්‍යාපනය කඩා වැටීම් හා සංවර්ධනය නොවුණු ස්ථාන දැකලා සමස්තය සංවර්ධනය වෙන්න නම්, ලෝකයක් හැටියට අපි තීන්දු කරන්න නම් ගරු සභාපතිතුමනි, අපි රටක් හැටියට ලෝක සම්මත තීන්දුවට එකඟතාවය පළ කළ යුතු වෙනවා. අන්න ඒ නිසයි අපි සංවර්ධනයේ කොතැන හිටියත්, අපි

[ ගරු නෙලුක් මල්ලව ]

අධ්‍යාපනයේ කොතැන හිටියත් 6% මිම්ම, 6% සීමාව අපි කරපින්නා ගන්නේ, ලෝකයේ සමස්ත ජාතීන් වෙනුවෙන්. ඒ නිසා මෙ 6% සීමාවට එද්දි කිව්වා, මේ ප්‍රගතිය තුළ යම් ප්‍රමාණයකින් - නලින්ද ජයතිස්ස ගරු මන්ත්‍රීතුමා කිව්වා, අධ්‍යාපනය සම්බන්ධයෙන් මේ දර්ශකය ඉදිරිපත් කරන කොට යම්යම් අවපාත වීම් තියෙනවා. යම් යම් කඩා වැටීම් තියෙනවා. ඒ කඩා වැටීම් තියෙන්නේ, වියදම අඩු කිරීමට නොවෙයි ගරු සභාපතිතුමනි. ආචාර්යවරු බඳවා ගන්න පුහුණු වීම් කළාම, ඒ ආචාර්යවරයා අවුරුදු විස්සක් තිහක් සේවය කරනවා. ගොඩනැගිල්ලක් හදපුවාම ඒ ගොඩනැගිල්ල අවුරුදු පනහක්, හැටක් තිබෙනවා. අද දවසේදී මේ රටේ දෙමව්පයන්ට තිබෙන්නා වූ ආවේණික වූ උවමනාවන්, ආවේණික අවශ්‍යතාවන් මත නගරය කරා ඇදෙන ජනගහන සංඛ්‍යාව වැඩියි. අද වෙනදාට වැඩිය නගරය ගමට ලං වෙලා. එදා දවසේදී නගරයට ගමන් කරන්න, තමන්ගේ ආසන්නම නගරයට ගමන් කරන්න මාර්ග පහසුකමක් නොමැතිව, ඒ වාගේම රථ වාහන පහසුකමක් නොමැතිව හිටපු ජනතාවට අද රථ වාහන පහසුකම ලැබිලා. අද මාර්ග පහසුකම ලැබිලා. පැය ගණන්, දින ගණන් නගරයට ගමන් ගිය අය අද විනාඩි 10 කින්, 15 කින් තමන්ගේ ආසන්න නගරයට යනවා. ඒ ආසන්න නගරයට යනකොට, ඒ නගරයට යන්නාට ඒ නගරයේ තිබෙන පහසුකම තමන්ගේ දරුවාට දෙන්න උවමනා වෙනවා. ඒ නිසා නගරයේ පාසල් පද්ධතියේ පන්ති කාමරයෙන්, පන්ති කාමරය වැඩි වෙද්දී, ගමේ පාසලේ පන්ති කාමරයෙන් පන්ති කාමරය අතහැරෙනවා. ඒ නිසා අද දවසේදී භෞතික සම්පත් වැඩි දියුණු කිරීමට අති විශාල මුදලක් යෙදිය යුතු නැහැ. ඒක අපි විශ්වාස කළ යුතුයි. වාර්ෂිකව එක් වසරකදී සංවර්ධන ඉලක්ක සම්පූර්ණ කර ගැනීම වෙනුවෙන් භෞතික සම්පත් වැඩි දියුණු කරමින් යම් ප්‍රතිපාදනයක් යෙදෙව්වා නම්, ඒ යොදවපු දේ ඒ වසරේ සාක්ෂාත් කරගත්තා නම් ගරු සභාපතිතුමනි, ඊළඟ වසරේත් භෞතික සම්පත් සඳහා මුදල් වැඩි කළ යුතු නැහැ. භෞතික සම්පත ස්ථාවරයි. ස්ථාවර නොවන වියදම් සියල්ල වෙනුවෙන් විතරයි ප්‍රතිපාදන වෙන් කළ යුතුව තිබෙන්නේ.

ඒ නිසා අද දවසේදී පෞද්ගලික අධ්‍යාපනය වෙනුවෙන්, ඒ වාගේම අනිකුත් ජාත්‍යන්තර පාසල් ආදියට බහුල වශයෙන් ශිෂ්‍යයෝ ඇදෙන සමයක, ඒ සඳහා යම් බරපතළ ඉල්ලුමක් තිබෙන සමයක මා විශ්වාස කරන්නේ නැහැ, මේ සංඛ්‍යාත්මක අගයකට අරගල කළ යුතුයි කියලා. අද දවසේ දී අධ්‍යාපනය බොහෝ වේලාවට ජනතාවට දැනෙන ආකාරයේ සටනක් මෙහෙය විය හැකි, ඇවිලිය හැකි, ගිනි තැබිය හැකි තැනක් බවට පත් කරලා තිබෙනවා. මේ නිසා මේ ගිනි තැබීම මූලික කරගෙන, මේ ගිනි තැබීම පරමාර්ථ කරගෙන බොහෝ වේලාවට විශ්ව විද්‍යාල ආචාර්යවරුන් හා අනිකුත් සියලුදෙනාම මේ වෙනුවෙන් යොමු වෙනවා. ඒ වෙනුවෙන් දේශපාලන බලවේග ක්‍රියාත්මක වෙනවා. ගරු සභාපතිතුමනි, මෙතැනදී අපි අමතක නොකළ යුතු තවත් කාරණයක් තිබෙනවා. මා කියන්නේ නැහැ, විශ්ව විද්‍යාල ආචාර්යවරු තමන්ගේ දේශපාලන හයිය හදාගන්න එක්තරා දේශපාලන පක්ෂවල සාමාජිකයන්ට වරදාන දෙනවා කියලා. විශ්ව විද්‍යාල ආචාර්යවරු ඒ ඒ විශ්ව විද්‍යාලයෙන්, විශ්ව විද්‍යාලයට සමහර දේශපාලන පක්ෂ නියෝජනය කරන පුද්ගලයන්ට පන්ති සාමාර්ථ දෙනවා කියලා මම කියන්නේ නැහැ. ඔවුන්ව ආචාර්ය මණ්ඩලයට ගන්නවා කියලා මම කියන්නේ නැහැ. හැබැයි, ඔවුනගේ පුද්ගලික අභිමතාර්ථයට මේ සමාජ දර්ශක පාවිච්චි කිරීම වැරැදියි කියලා මම විශ්වාස කරනවා. ඒ නිසා එය නොකර සිටීම මම හිතන්නේ මෙතැනදී වැදගත්. ඒ විතරක් නොවෙයි. අද දවසේදී අධ්‍යාපනය අතහැරපු පුද්ගලයෝ, ඇත්තටම ගත්තාම අධ්‍යාපනය තුළ අධ්‍යාපන වගකීම තම කරට අරගෙන රටේ ජනතාවට තිබෙන්නා වූ අවස්ථා පාවිච්චි කරමින් එය පැහැර හරින පුද්ගලයෝ නිසාත් මේ අධ්‍යාපනය නැති වීම් තිබෙනවා.

මම පුංචි උදාහරණයක් කියන්නම්. පසුගිය කාලයේ පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ දන්ත වෛද්‍ය පීඨයට ශිෂ්‍යයෙක් ඇතුල් වෙනවා. වෙන කවුරුත් නොවෙයි. මේ පුද්ගලයා උදුල් ප්‍රේමරත්න. උදුල් ප්‍රේමරත්න කියන පුද්ගලයා දන්ත වෛද්‍ය පීඨයට ඇතුල් වෙලා අවුරුද්දක් විතර දේශපාලනය කිරීමේ පරමාර්ථයෙන් එතැනින් පිට වෙනවා. දන්ත වෛද්‍ය පීඨයට දන්ත වෛද්‍යවරයෙක් රටට ඇතුල් කරන්න තිබ්බ සම්පත නැතිව යනවා. ඒ විතරක් නොවෙයි. බිමල් රත්නායක කියන පුද්ගලයෙක් මොරටුව විශ්ව විද්‍යාලයට ඇතුල් වෙනවා. පරිගණක ඉංජිනේරුවෙක් වෙන්න. පරිගණක ඉංජිනේරුවෙක් වෙන්න බිමල් රත්නායක කියන පුද්ගලයා ඇතුල් වෙලා අවුරුද්දක් ඇතුළත -

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

නලින්ද ජයතිස්ස ගරු මන්ත්‍රීතුමා -

**ගරු නෙ ක් මල්ලව**
Hon. Neluk Mallawa

ඔහු අධ්‍යාපනය සම්පූර්ණ කරනවා. අධ්‍යාපනය සම්පූර්ණ නොකර ඒ අධ්‍යාපනයේ මුදල නාස්ති කරලා නැවත වාරයක් අධ්‍යාපනයට මුදල් වැඩි කරන්නය කියලා කථා කරනවා. අද දවසේදී ශිෂ්‍යයන්ට හිමි වන වරප්‍රසාද වෙනුවෙන් රටේ ජාතික ධනයෙන් යම් ප්‍රමාණයක් වෙන් වෙනවා. හැබැයි, එක්තරා දේශපාලන පක්ෂයකට හෝ තවත් දේශපාලන ප්‍රවාහයකට දේශපාලන පදනම හදාගන්න, දේශපාලන කඳවුරු නිර්මාණය

කරන්න වරප්‍රසාද, පහසුකම් දෙන්න නම් මේ මුදල් වෙන් වෙන්නේ ගරු සභාපතිතුමනි, මා ඒ වෙනුවෙන් නම් අනුමත කරන්නේ නැහැ. ඒ නිසා මෙන්න මෙතැනදී ගරු සභාපතිතුමනි, මා මේ පළාත් සභාවෙන් ඉල්ලා සිටිනවා. අපේ අද දවසේ කරන පිරිවැයට සාධාරණය කරනවා නම්, නාස්තිය අවම කරනවා නම්, අවම නාස්තිය තුළ උපරිම ප්‍රතිඵලය කරා යන්න පුළුවන්කමක් තිබෙනවා නම්, මේ යොදවන මුදල ඵලදායි ආකාරයට යොදවා ගැනීමේ හැකියාව තිබෙනවා නම් මා හිතන්නේ, මේ මුදල ප්‍රමාණවත් කියලා. ඒ නිසා මේ දර්ශක සම්පූර්ණ කරගන්න, මේ යුනෙස්කෝව හදලා දුන්න ඉලක්කය, 6% නොවෙයි. එය 10% කිරීමේ ගැටලුවක් නැහැ. අපට තිබෙන ගැටලුව මේ 6% යේ සටන් පාඨය හුදු දේශපාලන උවමනාවෙන් කරන දෙයක් වීමයි. ඒ දේශපාලන උවමනාවෙන් කරන දේ හෙට දවසේදී ජනතාවට යම් වරප්‍රසාදයක් ලැබෙනවා කියලා, ඒ වෙනුවෙන් සටන් පාඨය හැදුවාම ජනතාව ඒ වෙනුවෙන් යොමු වෙනවා. හැබැයි එහි ඇත්ත අරුත දන්නේ නැහැ. අද දවසේදී අධ්‍යාපනය ඉහළින් තියන්න රජය ගන්නා උත්සාහය ප්‍රශංසනීයයි. ඒ වෙනුවෙන් කරන කැපවීම ප්‍රශංසනීයයි. මේ දර්ශකවලට ඇතුළත් වෙන්නේ නැහැ, පසුගිය වර්ෂයේදී ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය දුන්න ප්‍රතිපාදන. ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය ශිෂ්‍යයින්ගේ භෞතික සම්පත් වැඩි කරන්න දුන්න ප්‍රතිපාදන මේ දර්ශකවලට එන්නේ නැහැ. විවිධ ආධාර උපකාර මඟින් ලැබෙන ප්‍රතිපාදන මේ කිසිම දෙයක්, මෙයට අන්තර්ගත වෙන්නේ නැහැ. ඒ නිසා මේ තුළ විද්‍යමාන නොවන - දළ ජාතික නිෂ්පාදනයෙන් පමණක් නොවෙයි අධ්‍යාපනය නඩත්තු වෙන්නේ. අනිකුත් විවිධාකාරයේ ශීර්ෂයන් යටතේ නඩත්තු වෙනවා. මේ ශීර්ෂයන් යටතේ නඩත්තු වන්නා වූ අධ්‍යාපන කටයුත්ත වෙනුවෙන් මේ තිබෙන සංඛ්‍යා ලේඛනයන් නිවැරදි ලෙස ගෙනෙන්න. නිවැරදි ලෙස ගත්තාම අද දවසේ ඔවුන් පෙන්වන මේ 1.86 ක ප්‍රමාණය නොවෙයි ඇත්ත තත්ත්වය. ඊට එහා ගිය ප්‍රමාණයක් තිබෙනවා. ඒ නිසා එහි ඇත්ත තත්ත්වය සමාජය තුළට ගෙනෙන්න. ඇත්ත තත්ත්වය ගෙනහැර පෑවාම මම හිතන්නේ සමාජය තෘප්තිමත් වෙයි. හුදු දේශපාලන අරමුණුකින් අවම දර්ශක පෙන්වමින් දේශපාලනයේ යෙදෙන්න එපාය කියලා ඉල්ලා සිටිමින් මම නිහඬ වෙනවා. ස්තුතියි.

**ගරු රේණුක දුෂ්‍යන්ත පෙරේරා** - ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. Renuka Dushyantha Perera - Chief Government Whip

ගරු සභාපතිතුමනි, විනාඩි 40 ක කාලයක් පක්ෂයට තිබෙනවා. එතකොට ඔබතුමා කිව්වා, මන්ත්‍රීවරයෙකුට විනාඩි 05 යි තිබෙන්නේ කියලා. එතකොට විනාඩි 30 යි වැටෙන්නේ. ඒ නිසා මම ඔබතුමාගේ අවධානය යොමු කරනවා. එක මන්ත්‍රීවරයෙකුට විනාඩි ගණන ඊට වැඩිය වෙනස් වෙන්න ඕනෑ කියන කාරණය.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

වෙනස් වෙන්න ඕනෑ. පැහැදිලියි. සුගත් මතුගමගේ ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට විනාඩි 05 ක කාලයක් තිබෙනවා.

[ පූ.භා. 10.26 ]

**ගරු සුගත් මතුගමගේ**
Hon. Sugath Mathugamage

ගරු සභාපතිතුමනි, නලින්ද ජයතිස්ස ගරු මන්ත්‍රීතුමා ඉදිරිපත් කරන ලද යෝජනාව සම්බන්ධයෙන් අදහස් දැක්වීමට අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන් ප්‍රථමයෙන්ම මම ස්තුතිවන්ත වෙනවා. ගරු සභාපතිතුමනි, නිවැරදි දැක්මක් සහිත යහගුණ පිරි පුරවැසියෙක් නිර්මාණය කිරීමේ කාර්යය සඳහා අධ්‍යාපනය අතිශයින්ම වැදගත් වෙනවා. ඒ වාගේම රටේ සංවර්ධනය සඳහා අවශ්‍ය කරන මානව ප්‍රාග්ධනය බිහි කිරීම සඳහා අවශ්‍ය වෙන්නේ අධ්‍යාපනය සහ පුහුණුවයි. මේ නිසා නලින්ද ජයතිස්ස ගරු මන්ත්‍රීතුමා ඉදිරිපත් කරන මේ 6% යේ තර්කය සම්බන්ධයෙන් අපට ගැටලුවක් නැහැ. 6% ක් නොවෙයි. එය 10% ක්, එහෙමත් නැත්නම් කියුබාවේ වාගේ 13% ක්, 14% ක් දක්වා ගියත් අපේ විරෝධතාවයක් නැහැ. හැබැයි මේක එක පැයකින්, එක රැයකින්, මාසයකින්, අවුරුද්දකින් කරන්න පුළුවන් කාර්යයක් නොවෙයි. මේක දිගුකාලීන ක්‍රියාවලියක්. ඒ නිසා අපි දිගුකාලීනව ඒ ඉලක්ක කරා යමු. ඒ පිළිබඳව ගැටලුවක් නැහැ.

හැබැයි, ඔහු මේ වඩා සාධාරණ වූ තර්කය භාවිතා කරන්නේ, ඒ තර්කයට යටින් තමන්ගේ දේශපාලන අරමුණු සාක්ෂාත් කර ගැනීම උදෙසා වන දේශපාලන වේදිකාවක් නිර්මාණය කර ගැනීම සඳහායි කියන එක නම් බොහොම පැහැදිලියි. ගරු සභාපතිතුමනි, දැන් මෙතුමන්ලා බොහෝවිට අධ්‍යාපනය සඳහා වෙන් කරන මුදල දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් මතම හැපෙනවා මිසක් පසුගිය කාලය තුළ මේ රටේ අධ්‍යාපනය සඳහා වෙන් කළ මුදල් ප්‍රමාණය ප්‍රමාණාත්මකව සිදු වෙලා තිබෙන වැඩිවීම් පිළිබඳව කථා කරන්නේ නැහැ. ඒවා වසන් කරනවා. අපි අරගෙන බැලුවොත් 2011 වර්ෂයේ අධ්‍යාපනය සඳහා වෙන් කළ - ගරු සභාපතිතුමනි, දැන් මෙතුමන්ලා 6% තර්කය ඇතුළේ බොහෝවිට කථා කරන කාරණාවක් තිබෙනවා. 1.9% ක්, 2% ක් වාගේ සුළු ප්‍රමාණයක් තමයි අධ්‍යාපනයට මේ රජය වෙන් කරන්නේ කියන එක. මෙතුමන්ලා මේ තර්කය බොහෝවිට ගොඩනහනු ලබන්නේ, මධ්‍යම ආණ්ඩුව විසින් වෙන් කරනු ලබන මුදල් සම්බන්ධයෙන් පමණයි. හැබැයි, මේක ඇතුළේ පළාත් සභාවන් අධ්‍යාපනය සඳහා වෙන් කරන මුදල් පිළිබඳව කථා කරන්නේ නැහැ.

ගරු සභාපතිතුමනි, පළාත් අධ්‍යාපන විෂයය සඳහා පසුගිය වර්ෂවල වෙන් කළ මුදල් පිළිබඳව සලකා බැලුවොත් 2009 වර්ෂයේ රුපියල් මිලියන 20,754 ක් අධ්‍යාපනය සඳහා වෙන් කරලා තිබෙනවා. 2010 මේක රුපියල් මිලිය 17976 ක්. මේක 2013 වන විට රුපියල් මිලියන 20,064 ක් දක්වා වැඩි වෙලා

තිබෙනවා. බස්නාහිර පළාත් සභාව තුළ පමණක් 2011 රුපියල් මිලියන 14,821 කුත්, 2012 දී රුපියල් මිලියන 15,322 කුත්, 2013 දී රුපියල් මිලියන 16,465 කුත් අධ්‍යාපනය සඳහා වෙන් කරලා තිබෙනවා. බස්නාහිර පළාත් සභාවේ සමස්ත වියදමෙන් 40% ක් අධ්‍යාපනය සඳහා වෙන් කරනවා. මෙතුමන්ලා මේවා පිළිබඳව සැලකිලිමත් වෙන්නේ නැහැ. මෙතුමන්මලා මේවා වහනවා. මේවා පිළිබඳව කථා කරන්නේ නැහැ. ඒ වාගේම රටක අධ්‍යාපනය සඳහා වෙන් කරනු ලබන මුදල්, අධ්‍යාපනය සඳහා කරනු ලබන්නා වූ ආයෝජනයන්,

[ ගරු සුගත් මතුගමගේ ]

හුදෙක් මධ්‍යම ආණ්ඩුව විසින් කරනු ලබන්නා වූ ආයෝජනයන් පමණක් නොවෙයි. පෞද්ගලික අංශයත් අධ්‍යාපනය සඳහා දරන ලද වියදම් මේ දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතය ඇතුළට එන්නට ඕනෑ. නමුත් මොවුන් මේවා පිළිබඳව සැලකිලිමත් වෙන්නේ නැහැ. ගරු සභාපතිතුමනි, 2011 පෞද්ගලික අංශයේ අධ්‍යාපනය සඳහා කරලා තිබුණු ආයෝජනය රුපියල් බිලියන 146 ක්. මේක 2012 දී රුපියල් බිලියන 146 යි. 2013 රුපියල් බිලියන 147 යි. හැබැයි, මේවා පිළිබඳව මෙතුමන්ලා සැලකිලිමත් වෙන්නේ නැහැ. මේවා ගැන කථා කරන්නේ නැහැ. මේවා වහලා මධ්‍යම ආණ්ඩුව සිය අයවැයෙන් අධ්‍යාපනය සඳහා වෙන් කරන මුදල් පිළිබඳව පමණයි කථා කරන්නේ. මේ සියලු වියදම් එකතු කරලා බැලුවොත් ගරු සභාපතිතුමනි, දළ දේශීය නිෂ්පාදිතයෙන් 5% කට ආසන්න මුදල් ප්‍රමාණයක් අධ්‍යාපනය සඳහා වෙන් කෙරෙනවා. ඒ වාගේම පසුගිය කාලය තුළ අධ්‍යාපනයට වෙන් කරලා තිබෙන මුදල් ප්‍රමාණය ප්‍රමාණාත්මක වශයෙන් අරගෙන බැලුවොත් සැලකිය යුතු ලෙස වැඩි වෙලා තිබෙනවා. 2005 වර්ෂයේ අධ්‍යාපනයට වෙන් කළේ, රුපියල් බිලියන 53 යි. නමුත් මේක 2009 වන විට රුපියල් බිලියන 91 දක්වාත්, 2011 රුපියල් බිලියන 136 දක්වාත් වැඩි වෙනවා. 2013 දී රුපියල් බිලියන 163 ක් අධ්‍යාපනය සඳහා වෙන් කරලා තිබෙනවා. 2005, 2013 කාලපරිච්ඡේදය තුළ අධ්‍යාපනය සඳහා වෙන් කරන ලද මුදල 207% කින් වැඩි වෙලා තිබෙනවා. හැබැයි මෙතුමන්ලා ඒ පිළිබඳව කථා කරන්නේ නැහැ.

**ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Felician De Silva

ඇමැති vacancy යක් එහෙම තියෙනවාද?

**ගරු සුගත් මතුගමගේ**
Hon. Sugath Mathugamage

මෙතුමන්ලා දකින්නේ, මේ අධ්‍යාපනයේ මහා දැවැන්ත සෝදා පාළුවක් තිබෙනවා. අධ්‍යාපනයේ මහා විශාල කඩා වැටීමක් තිබෙනවා කියලයි. හැබැයි මේ 2005, 2013 කාලසීමාව තුළ අධ්‍යාපනයට වෙන් කරලා තිබෙන මුළු මුදල් ප්‍රමාණය 207% කින් වැඩි වෙලා තිබෙනවා කියන කාරණය මෙතුමන්ලා හංගනවා. ඒක වහලා පටු සටන් පාඨ සහිත දේශපාලනයක් සඳහා මේ රටේ ජනතාව ගෙනි යන්න, මේ ජනප්‍රියවාදී ආණ්ඩුවට එරෙහිව ජනමතයන් ගොඩනහන්න වැරැදි සටන් පාඨයි ගරු සභාපතිතුමනි, පාවිච්චි කරන්නේ.

ඒ වාගේම ඒක ශිෂ්‍ය අධ්‍යාපනය සම්බන්ධයෙන් ගත්තොත් මේ රටේ එක ශිෂ්‍යයෙකුට වෙන් කරන මුදල් ප්‍රමාණය පසුගිය කාලය තුළ දිගින් දිගටම වැඩි වෙලා. 2007 දී එක් ශිෂ්‍යයෙක් සඳහා වෙන් කරනු ලැබූ මුදල වුණේ රුපියල් 18, 905/- යි. හැබැයි මේක 2010 වන කොට රුපියල් 25,924/- ක් දක්වා වැඩි වෙලා. ශිෂ්‍ය අධ්‍යාපන පිරිවැය 2007, 2010 කාලය තුළ 37% කින් වැඩි වෙලා තිබෙනවා. හැබැයි, මේවා මෙතුමන්ලා දකින්නේ නැහැ. ඒ නිසා අපි ආදරයෙන් ඉල්ලා සිටිනවා. ගෞරවයෙන් ඉල්ලා සිටිනවා. ගරු මන්ත්‍රීතුමනි, ඔය පාට කණ්ණාඩිය ගලවලා ලෝකය දිහා හරියට බලන්න. තමුන්නාන්සේලා අපටත් දීලා තිබුණා ඔය වර්ණ අන්ධ කණ්ණාඩිය. ඒ කණ්ණාඩිය දාලා තියෙද්දී අපටත් ඕක පෙනුනේ නැහැ. හැබැයි, අපි ඔය කණ්ණාඩි කුට්ටම ගැලෙව්වා. ඔය කණ්ණාඩි කුට්ටම ගලවලා ලෝකය දිහා අපි බලන්න ගත්තා. දැන් අපට හොඳට පේනවා. ඒ නිසා ගරු මන්ත්‍රීතුමනි, අපි ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා. දැන් ඔය කණ්ණාඩිය ගලවන්න. මම හිතන්නේ එතුමා කොරියානු සංචාරයේදී තාවකාලිකව ගලවලා තිබුණා. අපි ඔබතුමාට සුභාශිංසනය පිරිනමමින්, තමුන්නාන්සේගෙන් ඉල්ලා සිටිනවා. ඇත්ත හරියට දකින්න පුළුවන් විධියට වඩා යථාර්ථවාදී ලෙස මේ ප්‍රශ්නය දිහා බලන්න. පටු දේශපාලන කෝණයන්ගෙන් බලනවා වෙනුවට. ගරු සභාපතිතුමනි, -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට බෙහෙවින් ස්තුතියි. කාලය අවසන්.

**ගරු සුගත් මතුගමගේ**
Hon. Sugath Mathugamage

බොහොම ස්තුතියි.

[ පූ.භා. 10.31 ]

**ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Felician De Silva

ගරු සභාපතිතුමනි, ඉතාමත් කාලෝචිත යෝජනාවක් ඉදිරිපත් කරන මේ වෙලාවේ විශේෂයෙන්ම මගේ අදහසක් තිබෙනවා. එතුමාගේ මේ යෝජනාවේ 6% පිළිබඳව තිබෙනවා. ඇත්ත වශයෙන්ම රටක සම්පත කියන්නේ මහජනතාව. මහජනතාවගෙනුත් අපි වැඩිපුරම මුදල් ආයෝජනය කරන්න ඕනෑ රටේ සෞඛ්‍යයට සහ අධ්‍යාපනයට. මේක 6% ද, 10% ද, 15% ද කියන එක පිළිබඳව අපට තර්කයක් නැහැ. නමුත් අද මෙවැනි කතිකාවක් මේ රටේ ඇති වෙලා තිබෙන්නේ විශේෂයෙන්ම පසුගිය දවස්වල විවිධ ජනමාධ්‍ය ඔස්සේ අපට අසන්නට, දකින්නට ලැබුණා මේ රටේ පාසල් යන දරුවන්ට අද ඇති වෙලා

තිබෙන ශෝචනීය තත්ත්වය පිළිබඳව. පොල් ගෙඩි අටක කථාවක් මේ රටේ ජනප්‍රිය මාතෘකාවක් හැටියට ගියා. ඊළඟට දරුවෙකුට පාසල් අධ්‍යාපනය ලබා දෙන්නට තම පියාට ඔරුව විකුණන්න සිදු වුණු කථාව. අද වන කොට මේවා ඔක්කොම ජනමාධ්‍ය හරහා ප්‍රචාරය වන කථා විතරයි. හැබැයි ඇඬූ කඳුලින්, මේ කඳුල අධ්‍යාපනය වෙනුවෙන් ගෙවල් ඇතුළට සිර වෙලා, එතැනින් එහාට යා ගන්න බැරුව මේ රටේ කොපමණ ජනතාවක් අද වන කොට පාසල් අධ්‍යාපනය අත ඇරලා තිබෙනවාද කියන කාරණාව පිළිබඳව අපි කවුරුත් කථා කරන්නේ නැහැ. මොකද, ඒවායේ සුවිශේෂී සිදුවීම් නොවෙන නිසාම ඒවා අද ගෙවල් ඇතුළේම හැංගිලා ගිහිල්ලා තිබෙනවා. ඒක නිසා අපි කියන්නේ, විශේෂයෙන්ම පළාත් සභාව හැටියට රජයට යෝජනා කිරීමක් තමයි මේ යෝජනාවේ තිබෙන්නේ. නමුත් අපේ පළාත් සභාවේ අපට කරන්න පුළුවන් කාර්ය භාරය, විශේෂයෙන්ම අපේ මුදල් ප්‍රකාශනය අවස්ථාවේදී වැඩිපුරම මුදල මේ පළාත් සභාවේ වෙන් කරන්නේ, ප්‍රධාන අමාත්‍යවරයා නියෝජනය කරන අධ්‍යාපන අමාත්‍යාංශයට. නමුත් මේ වනකොට ඒ මුදල ප්‍රමාණවත් නොවන බව හඟවමින් මේ පළාත් සභාව ඇතුළේ තිබෙන පාසල්වල මොන විධියේ මුදල් එකතු කිරීමේ ජාවාරම් සිද්ධ වෙනවාද? විවිධාකාරයෙන් දෙමව්පියන්ගෙන් එකතු කරනවා. ඒක නිසා දරුවෝ අපහසුතාවයට පත් වෙනවා. ආදී ශිෂ්‍යයෝ දෙනවා. සුභ පතන්නෝ දෙනවා. ඊට අමතරව වෙනත් විවිධ ක්‍රියා මාර්ගවලින් මුදල් එකතු කිරීමේ ව්‍යාපාර පාසල්වල යනවා. මේ ඔක්කොම කරන්නේ පාසල නඟා සිටුවීමට. නමුත් අපි ගත්තොත් එහෙම විශේෂයෙන්ම මේ බස්නාහිර පළාත අද ශ්‍රී ලංකාවේ තිබෙන අනෙක් පළාත් සභාත් එක්ක සංසන්දනය කරලා බලද්දී සම්පත් අතින් දියුණුම, පොහොසත්ම පළාත් සභාව. නමුත් අධ්‍යාපනයේ ප්‍රතිඵල දිහා බැලුවාම අපි ඉන්නේ කොතැනද? ඌව පළාත් සභාවට, සබරගමුව පළාත් සභාවට, වයඹ පළාත් සභාවට සාපේක්ෂව බස්නාහිර පළාත් සභාව කොතැනද ඉන්නේ කියන එක පිළිබඳව අපට විශාල ගැටළුවක් තිබෙනවා. මෙපමණ සම්පත් වියදම් කරනවා. මෙපමණ මුදල් වියදම් කරනවා. සම්පත් දෙනවා කියලා කියනවා නම් අපි කොතැනද ඉන්නේ? අධ්‍යාපනය වශයෙන් සභාවක් හැටියට ප්‍රගතිය කියන එක පිළිබඳව පසුවිපරමක් කරන්නට ඕනෑ.

විශේෂයෙන්ම දැන් මෙතැනදී නෙලුක් මල්ලව ගරු මන්ත්‍රීතුමා කථා කරද්දී විවිධ කථා කිව්වත් එතුමාත් පෞද්ගලිකව පිළිගත්තා මේ වෙන් කරන මුදල ඇත්ත වශයෙන්ම ප්‍රමාණවත් නැහැයි කියලා. වෙන් කරන මුදල 6% ට ගණනය කිරීම පිළිබඳව නොවෙයි තිබෙන්නේ. පාසලකට හරි එහෙම නැත්නම් මේ දරුවෙකුට හරි අධ්‍යාපනය ලබන්න උවමනා කරන මූලික සම්පත් ටික ඒ විද්‍යාලයට ලැබෙනවා නම්, ඕනෑ කරන පහසුකම් ටික ලැබෙනවා නම් එතැනට 6% ද, 10% ද, 15% ද, 20% ද කියන එක නොවෙයි කාරණාව තිබෙන්නේ. අපට ඒ කාලේ ඉගැන්නුවේ,

*"ඇල්ලට සිහාවත් රස නැති කැවිලි කකා*
*ඇල්මෙන් අකුරු උගනී ඉදිරි වැඩ තකා"* කියලා.

අන්න එහෙම තමයි දැන් මේ කියන්නේ. මොනවා හරි කමක් නැහැ. උඹලා ඇල්මෙන් අකුරු ඉගෙන ගනිල්ලා. හැබැයි සම්පත් දෙන්න පුළුවන් ප්‍රමාණය - අද මේ රටේ ජාතික පාසල්, පළාත් සභා පාසල්, පෞද්ගලික පාසල්, ජාත්‍යන්තර පාසල් ක්‍රියාත්මක වෙනවා. මේ පාසල්වලින් විශාලම පාසල් ප්‍රමාණය වැටෙන්නේ රජයට. පළාත් සභාවලට. ජාත්‍යන්තර පාසල් හරි, පෞද්ගලික පාසල් හරි සමස්තයක් විධියට ගත්තොත් ඉතාමත් අඩු ගාණක් තිබෙන්නේ. නමුත් දැන් කථා කරද්දී කිව්වේ, මේ පාසල්වලට තිබෙන ඉල්ලුම. ඒ ඉල්ලුම තිබෙනවා. යම්කිසි ව්‍යාපාර කරන, විශාල ධනයක් තිබෙන දෙමව්පියන්ට ඒ දරුවන් අරින්න පුළුවන්. නමුත් රටේ සමස්ත ජනගහනයෙන් 80% කට වැඩි ප්‍රමාණයක් ඉන්නේ අද ඉතාමත් අසරණ තත්ත්වයේ. ඒ අසරණ දරුවන්ට පිහිට වෙන්න තමයි නිදහස් අධ්‍යාපනය මූර්තිමත් කරලා තිබෙන්නේ. එතකොට ඒ නිදහස් අධ්‍යාපනයට උවමනා කරන පහසුකම් ටික අපට ලබා දෙන්න බැරි වෙලා තිබෙනවා. ඒක නිසා තමයි අද වනකොට රටේ විශාල කථිකාවක් ඇති වෙලා තිබෙන්නේ. ඒක පොල් ගෙඩි අට හරහා ආවාද, ඔරුව විකුණපු එක හරහා ආවාද කියන එක නොවෙයි ප්‍රශ්නය තියෙන්නේ. සැබෑ තත්ත්වය මේ. මේ ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරු අද මොනවා කිව්වත්, තමන්ගේ හෘද සාක්ෂියට තට්ටු කරලා බැලුවොත් එහෙම, එතුමන්ලා කරපු සමහර කථාවල් දිහා බැලුවාම, මේ පසු වුණු පළාත් සභාවේ අයවැය විවාදයේදී අධ්‍යාපන අමාත්‍යාංශය සම්බන්ධයෙන් කථා කරපුවා අරගෙන ආයිත් කියවලා බැලුවොත් එහෙම තමන් මේ යෝජනාවේදී කොතැනද ඉන්නේ කියන එක ගැන එතුමන්ලාට විශාල තර්කයක් තිබෙනවා.

ගරු සභාපතිතුමනි, මගේ මතය වෙන්නේ 6% කියන එක නොවෙයි. ගණනය කරන්න ඕනෑ. අපි රජයට යෝජනා කරනවා 6% ක ස්ථාවරයක ඉන්න කියලා. හැබැයි, පළාත් සභාව තුළ උපරිම වශයෙන් මේ මුදල වෙන් කිරීමේදී, සාධාරණව මේ කටයුතු සොයා බැලුවා නම් එහෙම තීන්ත ගාන්න සල්ලි දෙන්න උවමනාත් නැහැ. එහෙම නැත්නම් දෙමව්පියන්ගෙන් මුදල් එකතු කරන්න උවමනාවකුත් නැහැ. ඒ නිසා අපි යෝජනා කරන්නේ. ලබන සැරේ මුදල් ප්‍රකාශය මේ පළාත් සභාවට ඉදිරිපත් කරනකොට සමහර වෙලාවට මේ පළාත් සභාව විසුරුවලා තියෙන්න පුළුවන්. එහෙම නැත්නම් විසුරුවාලීමකට ලක් වෙලා තිබෙන්න පුළුවන්. ඒ අවස්ථාව වනකොට හරි පළාත් සභාවක් හැටියට බස්නාහිර පළාතේ අධ්‍යාපනය ලබන දරුවන්ගේ අනාගතය සුරක්ෂිත කරන්න මේ ප්‍රතිශතය සියයට ගණනින් වැඩි කර දායකත්වය ලබා දෙන්න කියන ඉල්ලීම කරමින් මම නිහඬ වෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මේ අවස්ථාවේදී මෙම සභාව උදැසන තේ විවේකය සඳහා විනාඩි 15 කට කල් තබනවා.

***ඊට අනුකූලව පළාත් සභාව තාවකාලිකව අත්සිටුවන ලදින් පූ.භා. 11.16 ට යළිත් රැස්විය.***

*Sitting, accordingly suspened untill 11.16 a.m. and then resumed.*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

යසපාල කෝරළගේ ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට විනාඩි 05 ක කාලයක් තිබෙනවා.

[ පූ.භා. 11.17 ]

**ගරු යසපාල කෝරළගේ**
Hon . Yasapala Koralage

ගරු සභාපතිතුමනි, නලින්ද ජයතිස්ස ගරු මන්ත්‍රීතුමා අධ්‍යාපනය වෙනුවෙන් 6% ක මුදල් වෙන් කිරීම සම්බන්ධව ගෙන ආ යෝජනාව දීර්ඝ වශයෙන් සාකච්ඡා වුණා. ගරු සභාපතිතුමනි, මම මේ අවස්ථාවේදී මතක් කර දෙනවා. නලින්ද ජයතිස්ස ගරු මන්ත්‍රීතුමා ඉන්නේ ලංකාවේද? නැත්නම් වෙනත් රටක තිබෙන සංස්කෘතියක් අනුව ඒ කෝණයකින්ද? මේ යෝජනාව සභාවට ගෙන ආවේ කියන එක පිළිබඳව මගේ කථාවේදී මම පොඩ්ඩක් පෙන්වා දෙන්න උත්සාහ කරනවා. අපේ සංස්කෘතිය අනුව මේ රටේ පාසල්, මේ රටේ පන්සල්, මේ රටේ රෝහල් ගොඩනැගී තිබෙන්නේ ජනතාවගේ වෙර වීරියෙනි. නැත්නම් මේ සංස්කෘතිය අනුව සිය ධනය පරිත්‍යාග කරලා නහා සිටවපුවායි. එහෙම නැත්නම් රජය මැදිහත් නොවී රජයට උදව් කරන, රජයට පරිත්‍යාග කරන ධානපතීන් සහ ඒ පරිත්‍යාගශීලීන් ඉන්න සංස්කෘතියක්, සමාජයක් තුළ තමයි අපේ මේ ආයතන මුල ඉඳලාම ගොඩ නැඟුණේ කියන එක මම මතක් කර දෙන්න ඕනෑ. එවැනි සංස්කෘතියක් තුළ තමයි අපේ පාසල් පද්ධතිය ක්‍රම ක්‍රමයෙන්, ක්‍රම ක්‍රමයෙන් ගොඩ නැඟුණේ. මම ඉතා පැහැදිලිව කියනවා. අපේ කොට්ඨාශයේ ඉන්න පී.ඩී. අබේරත්න ගරු මන්ත්‍රීතුමා දන්නවා.

ගරු සභාපතිතුමනි, අපේ හිටපු ප්‍රභුවරුවන් පාසල් පවත්වාගෙන යන්න තමන්ගේ භූමියේ, තමන්ගේ ඉඩකඩම්වල ගොඩනැගිලි හදලා පාසල්වලට පරිත්‍යාග කළා. විල්මට් ඒ පෙරේරා මහත්මා, ඒ වාගේම ඉන්ද්‍රලාල් හෙට්ටිආරච්චි මහත්මයා වාගේ අය පාසල් හදන්න තමන්ගේ භූමි පරිත්‍යාග කරපු අය. Building සකස් කරලා දීපු අය. එවැනි සංස්කෘතියක් එක්කයි මේ පාසල් පද්ධතිය ක්‍රම ක්‍රමයෙන්, ක්‍රම ක්‍රමයෙන් ඉස්සරහාට ආවේ. එහෙම ඇවිල්ලා අද මේ 6% කථාව මොන පදනමකින් කථා කරනවාද කියන එක පිළිබඳව මම දන්නේ නැහැ. 6% නොවෙයි. අපි කැමැතියි 20%, 25% වුණත් දෙන්න. අවශ්‍යතාවයක් තිබෙනවා නම්. ඒ අවශ්‍යතාවය මොකක්ද කියන එක අපි තේරුම් ගන්න ඕනෑ. මේ 6% ඉල්ලන්නේ මොකටද? වැටුප් සඳහාද? එහෙම නැත්නම් භෞතික සම්පත් අරගන්නද? එහෙම නැත්නම් වෙනත් දේවල් කරන්නද? කොතැනද අපේ අඩුපාඩුවක් වෙලා තිබෙන්නේ කියන එක පිළිබඳව අපි පොඩ්ඩක් වෙනම සමීක්ෂණය කරලා බලන්න ඕනෑ. මේ 6% කථාවට එහා පැත්තේ අපේ ගරු මන්ත්‍රීතුමන්ලා ප්‍රකාශ කළා ආර්ථික කටයුතු අමාත්‍යාංශයෙන් පසුගිය කාල සීමාව තුළදී පාසල් 1268 ටම වැසිකිළි, කැසිකිළි හදලා දුන්නා. ඉතුරු වුණු මුදල් වලින්. මේවා මේ 6% නැහැ. ළමා මිතුරු පාසල් පද්ධතිය නහා සිටුවන්න සෑම පාසලකටම ලක්ෂ 5 ගණනේ දුන්නා. මේවා මේ 6% කථාවේ නැහැ. මීට අමතරව මේ පාසල් පද්ධතිය ගෙනියන්නේ ගරු සභාපතිතුමනි, දෙමව්පියෝ. තමන්ට ඉන්න එකම වස්තුව තමන්ගේ දරුවා. ඒ දරුවා ඉගෙන ගන්න පාසල වෙනුවෙන් තමන්ට මොනවාද පරිත්‍යාග කරන්න බැරි? මම කියන්නේ නැහැ, ආර්ථික තත්ත්වයෙන් ඉතාමත් අඩු අයගෙන්, ආර්ථික තත්ත්වයෙන් තමන්ට ගෙවා ගන්න බැරි අයගෙන් පාසල් පද්ධතියේ ඉන්න විදුහල්පතිවරු බලහත්කාරකමින්, එහෙම නැත්නම් බලපෑම් මත මුදල් එකතු කරගන්න කථාව මම අනුමත කරන්නේ නැහැ. එතැනට මම විරුද්ධයි. නමුත් මමත් දරුවන් ඉන්න දෙමව්පියෙක් වශයෙන් මගේ දරුවා ඉගෙන ගන්න පාසල තුළ යම් දෙයක් කරන්න මට හැකියාවක් තිබෙනවා නම්, මට ඒ කාර්යය කරන්න කිසිසේත්ම මැළි වෙන්නේ නැහැ, ගරු සභාපතිතුමනි. නීත්‍යානුකූලව තාත්තා කෙනෙක් වුණු ඕනෑම කෙනෙක් මේ යෝජනාව ප්‍රතික්ෂේප කරනවා මිසක්, මේ යෝජනවා අනුමත කරන්නේ නැහැයි කියන එකයි මාගේ විශ්වාසය.

පාසල් පද්ධතිය වාගේම රෝහල් පද්ධතිය බලන්න. මම දන්නේ නැහැ, මෙතුමා රෝහලේ වෛද්‍ය වෘත්තිය කරනවාද කියලා. නමුත් රෝහල් පද්ධතිය බැලුවොත් එහෙම, විශේෂයෙන් අපේ රෝහල් බැලුවොත් එහෙමනම්, සියයට සියයක්ම තිබෙන්නේ රජයේ හදපු ගොඩනැගිලි නොවෙයි. දානපතීන් හදපු ගොඩනැගිලි. ඒ විතරක් නොවෙයි. අදත් අපේ රෝහල්වල තිබෙන ගොඩනැගිලි අලුත්වැඩියා කරන්නේ දානපතීන්. ව්‍යාපාරිකයෝ. එහෙමත් නැත්නම් කර්මාන්ත ශාලා. තමන්ගේ මුදල් තමන් විවිධ ආකාරයට මේ රටේ යොදවන සංස්කෘතියක් අපට තිබෙන්නේ. බලන්න කොයිතරම් පරිත්‍යාග කරන පුද්ගලයෝ අපේ ඉන්නවාද? ඒ අය මොකද කරන්නේ? වෙසක් උත්සවයට, පොසොන් උත්සවයට දන්සලක් ළඟට ගිහිල්ලා බලන්න. මොකද සල්ලි දීල ද කන්නේ ? නැහැ. ඒක තමයි අපේ සංස්කෘතිය.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාට තව විනාඩියක කාලයක් තිබෙනවා.

**ගරු යසපාල කෝරළගේ**
Hon . Yasapala Koralage

ඒක නිසා ගරු සභාපතිතුමනි, මෙතුමන්ලා මේ පොල් ගෙඩි අටක කථාවක් අල්ලගෙන දිගින් දිගට ආවා. මේ කථාව අමූලික

බොරුවක්. ඒ අමූලික බොරුව තුළින් තමන්ගේ දේශපාලන අරමුණ වටා ගමන් කරවන්න උත්සාහ කළා. අපි ඒකට ඉඩ දුන්නේ නැහැ. ගරු මහ ඇමැතිතුමා යථාර්ථය තේරුම් ගත්තා. අධ්‍යාපන අමාත්‍යාංශයත් යථාර්ථය තේරුම් ගත්තා. ඒක තේරුම් කර දීමේ හැකියාවක් අපට තිබුණු නිසා ඒ කථාව එහෙම්මම යට ගියා. අද ඒ මුවාවෙන් මේ 6% කථාව ඉස්මතු කරන්නේ කොතැනද කියලා මම දන්නේ නැහැ. අද අපේ පාසල් පද්ධතිය - අපි ඉතාමත් භය නැතිව ප්‍රකාශ කරනවා. අද විශේෂයෙන් පළාත් සභා පාසල් පද්ධතිය ගැන අපි භය නැතිව කියනවා. මෙය ඉතාමත් සුන්දර පාසල් පද්ධතියක් බවට පත් කරන්න පුළුවන් වුණේ, මේ පළාත් සභාවේ සහ දෙමව්පියන්ගේ ඕනෑකම් මත, දෙමව්පියන්ගේ උනන්දුව මත ඉතාමත් සුන්දර, දරුවෙකුට ආශාවක් ඇති වන ආකාරයේ, පාසල් යන්න ආශාවක් ඇති වන ආකාරයේ ප්‍රසන්න පරිසරයක් අද පාසල් පද්ධතිය තුළ තිබෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාගේ කාලය අවසන්.

**ගරු යසපාල කෝරළගේ**
Hon . Yasapala Koralage

ඒක නිසා ගරු සභාපතිතුමනි, මේ සියයට හයේ කථාව නොවෙයි. අපි ඕනෑම වේලාවක ලැහැස්තියි සියයට හය නොවෙයි, අවශ්‍යතාවය තිබෙනවා නම් සියට දහයක්, පහළොවක් වුණත් දෙන්න. අපි සෑම අවුරුද්දකම මේ මුදල් ප්‍රමාණය ක්‍රම ක්‍රමයෙන් වැඩි කරලා මිසක් ක්‍රම ක්‍රමයෙන් අඩු කරලා නැහැ .

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, කරුණාකරලා ඔබතුමාගේ කථාව අවසන් කරන්න.

**ගරු යසපාල කෝරළගේ**
Hon . Yasapala Koralage

අවුරුද්දෙන් අවුරුද්දට වැඩි කරලා මිසක් අඩු කරලා නැහැයි කියලා ප්‍රකාශ කරමින් මේ යෝජනාවට අපේ විරුද්ධත්වය ප්‍රකාශ කරමින් මම නිහඬ වෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ශ්‍රීනාත් මහේන්ද්‍ර පෙරේරා ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට විනාඩි 04 ක කාලයක් තිබෙන්නේ.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

හතරයි? ගරු සභාපතිතුමනි, පහක් තිබුණා නේ?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කාලය අඩු කළා.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ගරු සභාපතිතුමනි, අර නෙලුක් මල්ලව ගරු මන්ත්‍රීතුමාට දුන්න ඒවාට මගෙනුත් කපලාද මන්දා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

නැහැ. නැහැ. සිරිකමල් ද සිල්වා ගරු මන්ත්‍රීතුමාට විනාඩි පහක කාලයක් දුන්නා.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

එතුමාට විනාඩි හතක් තිබුණා නේ?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

විනාඩි පහයි තිබුණේ. ඔබතුමන්ලාගේ සංවිධායකතුමාගෙන් ඒ ගැන අහන්න. මම දන්නේ නැහැ.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ගරු සභාපතිතුමනි, අපට විනාඩි -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

විස්සයි ඔබතුමන්ලාට තිබෙන්නේ.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

විස්සයි. තුන්දෙනා නේ ?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

නලින්ද ජයතිස්ස ගරු මන්ත්‍රීතුමාට විනාඩි 08 ක් දුන්නා. සිරිකමල් ද සිල්වා ගරු මන්ත්‍රීතුමාට විනාඩි 05 ක් දුන්නා. දහ තුනයි. තව හතයි තිබෙන්නේ. ඔබතුමාට විනාඩි තුනහමාරයි.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ගරු සභාපතිතුමනි, -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට විනාඩි තුනහමාරයි.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

තුනහමාරයි. ගරු සභාපතිතුමනි, එහෙමනම් ඒකත් වෙන කාට හරි දෙන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එහෙමනම් කරුණාකර වාඩි වෙන්න. අජිත් මාන්නප්පෙරුම ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට විනාඩි හතරයි තිබෙන්නේ.

**ගරු අජිත් මාන්නප්පෙරුම**
Hon. Ajith Mannaperuma

මෙතුමාගේ කාලයත් එකතු වෙනවා නේ?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

නැහැ, ඒක දෙන්නේ නැහැ. එතුමාට ඒක අවශ්‍ය නැහැයි කිව්වා නේ?

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

මම කිව්වේ වෙන කාට හරි දෙන්නය කියලා.

[ පූ.භා. 11.26 ]

**ගරු අජිත් මාන්නප්පෙරුම**
Hon. Ajith Mannaperuma

ගරු සභාපතිතුමනි, නලින්ද ජයතිස්ස ගරු මන්ත්‍රීතුමාට ස්තුතිවන්ත වෙනවා, කාලෝචිත යෝජනාවක් රැගෙන ආවාට. ගරු සභාපතිතුමනි, මොකද, අපි දකිනවා, අපේ රටේ මිනිස්සුන්ගේ තිබෙන වැඩිම උවමනාව තමයි අධ්‍යාපනය. අපේ අය කැදරකමින්, ඒ කියන්නේ අධ්‍යාපනය ලබා ගැනීමේ අරමුණු කරගෙන පිපාසයකින් වාගේ පෙළෙනවා. රජය මේ ගැන තුට්ටුවකටවත් මායිම් කරන්නේ නැහැ. ඒ නිසා මම හිතනවා, නලින්ද ජයතිස්ස ගරු මන්ත්‍රීතුමාගේ යෝජනාවක් නොවෙයි මේක. මේක ඉදිරිපත් කිරීමක්. 6% ක් අධ්‍යාපනය සඳහා වෙන් කළ යුතුයි කියලා යුනෙස්කෝ ආයතනය ඉදිරිපත් කරලා තිබෙනවා. ඉතින් මම නලින්ද ජයතිස්ස ගරු මන්ත්‍රීතුමාගේ කැමැත්ත පරිදි මේක පොඩ්ඩක් වෙනස් කරනවා. අවමය 6% ක් විය යුතුයි කියන එක. 6% ක් කියන එක නොවෙයි. අවමය 6% ක් විය යුතුයි කියලා. ඇත්තටම අපි දන්නවා, අනාගතයේ දැනුම පදනම් කරගත්තු ලෝකයක් නිර්මාණය වෙන්නේ. අපි තවමත් ඉන්නේ මෙහෙකාරයෝ රට අරින තත්ත්වයක. මෙහෙකාරයෝ රට ඇරලා ඒ අයව ප්‍රසිද්ධියේ බෙල්ල කපන, එහෙම නැත්නම් ඇණ ගහන, එහෙම නැත්නම් විවිධ දූෂණවලට ලක් වෙලා ආපසු ලංකාවට අසරණ වෙලා එන යුගයක් මෙය. ඒ අයගේ දෙමව්පියන් අසරණ වන යුගයකට අද අප පත් වෙලා තිබෙන්නේ. ඉතින් එහෙම වෙලාවක අපට, අපේ රටේ මිනිස්සුන්ට දැනුම ඉගෙන ගැනීමේ අවශ්‍යතාවය දැඩි ලෙස තිබෙනවා. මේ ඉගෙන ගන්න අය - අපි දන්නවා. මේ රටෙන් යහපතක් වෙන්නේ නැහැයි කියලා හිතාගෙන හැමෝගෙම හිතේ තිබෙන්නේ, මේ රට හැර යන්න. ඉගෙන ගත්තු අයත් රට හැර ගිහිල්ලා තිබෙනවා. මොකද හේතුව, මේ වර්තමාන රජය තුළ අධ්‍යාපනය සඳහා තැනක් දෙන්නේ නැහැ. විශේෂයෙන්ම අපි දැක්කා නිදහස මේ රටට ලැබෙන කොට අපේ අධ්‍යාපනය ජපානයට විතරයි දෙවැනි වෙන්න තිබුණේ. නමුත් වර්තමානය වන විට අපි ගොඩක් පල්ලෙහාට ගිහිල්ලා. 2012 Ranking එක බැලුවොත් - මොරටුව විශ්ව විද්‍යාලය ගත්තොත් ලෝකයෙන් 3279. එතකොට පේරාදෙණිය විශ්ව විද්‍යාලය බැලුවොත් ලෝකයෙන් 2432. නමුත් එහෙම වුණු රටක් නොවෙයි අපි. බොහොම ඉස්සරහින් හිටපු රටක්. ඉතින් මේ අධ්‍යාපනය ගැන රජය ගණන් ගන්නේ නැති වුණාම, මේකෙන් බොර දියේ මාළු අල්ලන පිරිසක් බිහි වෙනවා.

ගරු සභාපතිතුමනි, ඔබත් නියෝජනය කරන ආසනයේ තමයි මමත් ඉන්නේ. පෙබරවාරි, මාර්තු වන විට දෙමව්පියන් කීදෙනෙකුගෙන් පැමිණිලි එනවාද? ලක්ෂ 02 ක් ගත්තා මගේ ළමයාව ඉස්කෝලෙට දානවා කියලා. ඉස්කෝලෙත් නැහැ. ඒ ගත්තු කෙනත් නැහැ. එහෙම පැමිණිලි අනන්ත අපට එනවා. මුදල් ගන්නවා. ඇයි? මේ අඩුපහසුකම් නිසා. අපේ යසපාල කෝරළගේ ගරු මන්ත්‍රීතුමා ප්‍රකාශ කරනවා, කරන්න දේවල් නැහැයි කියලා. කරන්න දේවල් තිබෙනවා නම් 15% ක් වුණත් දෙනවා කියනවා. කරන්න තියෙන දේවල් ගැන දන්නේ නැහැ. කොටින්ම කියනවා නම්, ජාත්‍යන්තර පාසල් හැම තැනම ඇති වෙනවා. මොන්ටිසෝරියත් ජාත්‍යන්තර වෙනවා. මේ දෙමව්පියන් ඉංග්‍රීසි භාෂාවෙන් වැඩ කරපු අය නොවෙයි. නමුත් අම්මලාට තාත්තලාට, දෙමව්පියන්ට ඕනෑකම තිබෙනවා, දරුවාට හොඳට උගන්වන්න. ඒ හින්දා ජාත්‍යන්තර කියන නමට යනවා. නමට යවලා - මම දන්නවා. අධ්‍යාපන ක්ෂේත්‍රයේ තිබෙනවා මූලික අධ්‍යාපනය, ප්‍රාථමික අධ්‍යාපනය අනිවාර්යයෙන්ම තමන්ගේ මව් භාෂාවෙන් ලැබිය යුතුයි කියලා. නමුත් මේකට රජය අත පොවන්නේ නැති හින්දා, රජය මේකට සල්ලි වියදම් කරන්නේ නැති හින්දා, රජය මෙහි පාලනය ගන්නේ නැති හින්දා බොර දියේ මාළු අල්ලන පිරිසක් බිහි වෙලා තිබෙනවා. මේ දෙමව්පියන්ගේ ඕනෑකම ලැහැස්ති කරලා. දේශපාලඥයෝ පවා පාසලට ගියාම විවිධ පොරොන්දු දෙනවා. අපේ ඉස්කෝලෙට ගොඩනැගිල්ලක් ඕනෑ කියලා දෙමව්පියෝ ඉල්ලනවා. හා දෙන්නම් කියලා එනවා. ගොඩනැගිල්ලක් දෙනවා. මේ රට තුළ අධ්‍යාපනය ගැන කිසිම ප්‍රතිපත්තියක් නැහැ. අපි දකින්නේ නැහැ. ජනගහනය වැඩි වෙනවා. රටේ ජනගහනය එන්න එන්න වැඩි වෙනවා. නමුත්

පාසල් වැහෙනවා. ඇයි? මිනිස්සු ඉගෙන ගන්නේ නැති හින්දා ද? නැහැ. අධ්‍යාපනය වෙනුවෙන් රජය උනන්දුවක් දක්වන්නේ නැති හින්දා. රජය අධ්‍යාපනය වෙනුවෙන් වියදම් කරන්නේ නැති හින්දා පෞද්ගලික පාසල් ඇති වෙන්න පටන් අරගෙන තිබෙනවා. ටියුෂන් පන්ති පටන් අරගෙන තිබෙනවා. ඒ අය නිවැරැදි අධ්‍යාපනය දෙන්නේ නැහැ. එදා ගුරුවරයෙක් වුණාම අපි දැක්කා. ඉස්කෝලේ නෝනා කෙනෙක් පාරේ යන්නේ, ඉස්කොලේ මහත්මයෙක් පාරේ යන්නේ කියන තරමට එයාගේ හැසිරීම තුළ ඒක අපට කියන්න පුළුවන් වුණා. නමුත් වර්තමානය වන විට ඒ ක්ෂේත්‍රය පිරිහිලා. මම විශේෂයෙන්ම ගරු සභාපතිතුමනි, අවධානය යොමු කරනවා. වැඩ කරන්න දේවල් නැත්නම් අධ්‍යාපනය වෙනුවෙන් කවුන්සිලයක් තිබෙන්න ඕනෑ. ගුරුවරයා කියන එක වෘත්තියක්. දැනුම තිබෙන මිනිහා ගුරුවරයෙක් වෙන්නේ නැහැ. උගන්වන්න පුළුවන් මිනිහයි ගුරුවරයෙක් වෙන්නේ. නමුත් අද වර්තමානයේ අපි දකිනවා. අධ්‍යාපනයේ කිසිම ප්‍රතිපත්තියක් නැති හින්දා විශ්ව විද්‍යාලයෙන් පාස් වුණු ගමන්ම ඉස්කෝලේට පත්වීම් දෙනවා. එහෙම නොවෙයි. ගුරු වෘත්තිය ඉගෙන ගන්න ඕනෑ. දැනුම තිබුණයි කියලා ළමයෙකුට උගන්වන්න අරින්න බැහැ.

**ගරු අශෝකා ලංකාතිලක**
Hon. Asoka Lankathilaka

අපි රස්සාවල් ටිකක් දෙනකොට ඔබතුමන්ලා කෑ ගහනවා.

**ගරු අජිත් මාන්නප්පෙරුම**
Hon. Ajith Mannaperuma

නැහැ. අපි රස්සාවල් දෙන්න එපාය කියනවා නොවෙයි. රස්සාවල් දෙන්න ඕනෑ. ගුරු වෘත්තිය බොහොම උතුම් වෘත්තියක්. නමුත් වෙලා තිබෙන්නේ, විශ්ව විද්‍යාලයෙන් ලකුණු ගත්ත ගමන් ගුරු වෘත්තියට යවන්න බැහැ. අඩුම ගණනේ අවුරුද්දකවත් Training එකක් දෙන්න ඕනෑ. එදා ගුරුවරු එහෙමයි. ඒකයි එදා අපි ගුරුවරුන්ට ගරු කළේ. ඒ වෘත්තිය ගැන දැඩි අවබෝධයක් තිබුණා. අද ඒක නැහැ. අපි දකිනවා සමාජයේ ඒක පල්ලෙහාට වැටීගෙන, වැටීගෙන යනවා. ඒ විතරක් නොවෙයි. මේ රටේ ජාතික අධ්‍යාපන ප්‍රතිපත්තියක් තිබෙන්න ඕනෑ. අධ්‍යාපනය සඳහා සල්ලිවලින් කරන්න දේවල් නැහැයි කියලා කිව්වා. 6% ක් වෙන් කරලා කරන්න දෙයක් නැහැයි කිව්වා. අවශ්‍යතා තිබෙනවා නම් ඕනෑ තරම් සල්ලි දෙන්නම් කිව්වා. නමුත් අඩුම ගණනේ ජාතික අධ්‍යාපන ප්‍රතිපත්තියක් මේ රටේ ඇති කරලා, එක එක ආණ්ඩු එනකොට එක එක ප්‍රතිපත්ති වෙනස් වෙන්නේ නැතිව, එක එක ඇමැතිවරයා බිහි වන කොට පාසලේ තත්ත්වය වෙනස් වෙන්නේ නැතිව, පාසල්වලට එක එක නම් දාන්නේ නැතිව එක ප්‍රතිපත්තියක යන්න පුළුවන් පාසල් පද්ධතියක් තිබෙන්න ඕනෑ.

ඒ විතරක් නොවෙයි. ගමට පාසලක් දෙන්න ඕනෑ. අපි දකිනවා, ගමේ පාසල් වැහිලා නගරයේ පාසල් ඇති වනකොට ගමේ අයට ඕනෑ නැතිකමට - ඒ කියන්නේ ගමේ අයට යන්න ඕනෑකමට වියදම් කරගෙන කොළඹ යනවා නොවෙයි. නැත්නම් නගරයට යනවා නොවෙයි. ගමේ පාසල ක්‍රමවත් තත්ත්වයක නැහැ. එහෙමනම් වියදම් කරනවා නම් මම හිතන්නේ 6% මදී. 6% ක් වියදම් කරනවා නම් ඒකත් මදී. මොකද, හැම ගමකටම, හැම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයකටම අඩුම ගණනේ ප්‍රාථමික පාසලක්වත් පිහිටුවන්න ඕනෑ. අපි දකිනවා, දේශපාලඥයන් පාසල්වලට ගියාම පොරොන්දු දෙන්නේ එක ගොඩනැගිල්ලක් හදන්න. නමුත් අපි දකිනවා, අද තිබෙන ජනගහනය තුළ ඒ පාසලට ගොඩනැගිල්ලක් හදන්නේ නැහැ. ප්‍රමිතියකින් යුක්ත නව පාසලක් ඇති කරන්න ඕනෑ. ඒ සඳහා වියදම් කරන්න ඕනෑ.

ඒ විතරක් නොවෙයි. අධ්‍යාපන කවුන්සිලයක් ඇති කරන්න කියලා විශේෂයෙන්ම කියනවා. අනික් පිළිගත් වෘත්තීන්වලට එහෙම කවුන්සිලයක් තිබෙනවා. අපි දැක්කා, අපේ පෙර පාසල් ගුරුවරු සඳහා යම් ප්‍රතිපත්තිමය මාලාවකට ආවා. ඒ වාගේ ගුරුවරයා තුළත් ඒ වාගේ ප්‍රතිපත්ති මාලාවකට එන්න ඕනෑ. අන්න ඒ තත්ත්වය විශේෂයෙන්ම ඇති කරන්න ඕනෑ. ඒ විතරක් නොවෙයි. ගරු සභාපතිතුමනි, අපේ නෙලුක් මල්ලව ගරු මන්ත්‍රීතුමා නාස්තිය ගැන කථා කළා. මේ රජය විතර නාස්ති කරන රජයක් මම හිතන්නේ අපි දැක්කේ නැහැ. අධ්‍යාපනයට වියදම් කරන්නේ නැතිව පාරවල්වලට වියදම් කරනවා. මොකද, පාරවල් කාපට් කරපුවාම 300% ක කොමිස් එකක් ලබනවා. කෝටි තුනෙන් හදන්න පුළුවන් පාර කෝටි 12 ක් දක්වා යනවා. ටෙන්ඩර්වලින් තොරව පාරවල් හදනවා. නමුත් මේ උනන්දුව අධ්‍යාපනය වෙනුවෙන් නැහැ. පාරවල් කාපට් කරන්න විතරයි මේ උනන්දුව තිබෙන්නේ. එහෙමනම් ඒ නාස්තිය නැති කරනවා නම්, මීට වඩා මේ අධ්‍යාපන තත්ත්වය වැඩි දියුණු කරන්න පුළුවන්. ඒ විතරක් නොවෙයි. අපේ ගුරුවරුන්ට පුළුවන් විදේශ රටවල්වල, යුරෝපීය රටවල්වල, ඕස්ට්‍රේලියාව වාගේ රටවල්වල රැකියා කරන්න. ඒ රටවල ගුරුවරුන්ට ඕනෑ තරම් ඉල්ලුම් තිබෙනවා. නමුත් ඒ ප්‍රමිතියේ ඉන්න ගුරුවරු අපට නිෂ්පාදනය කරගන්න බැරි කමක් තිබෙන්නේ. අපි අර විශ්ව විද්‍යාලයෙන් එළියට ආපු ගමන්, එහෙම නැත්නම් විභාගයෙන් පාස් වුණු ගමන්, තරග විභාගයක් කරපු ගමන් එක පාරට ඉස්කෝලෙට අරිනවා උගන්වන්න. නමුත් ගුරු වෘත්තිය කියන දේට -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාට තව විනාඩියක කාලයක් තිබෙනවා.

**ගරු අජිත් මාන්නප්පෙරුම**
Hon. Ajith Mannaperuma

ඒ හින්දා විශේෂයෙන්ම කියනවා. අවම වශයෙන් 6% ක් අධ්‍යාපනයට වෙන් කරන්න ඕනෑ. එත් මම හිතනවා, ආරම්භයක් වශයෙන් ඒක මදි වෙනවා. වර්තමානයේ අපි දකින්නේ, රාජපක්ෂලාට කිරි අපට කැකිරි කියන සංස්කෘතිය තමයි තිබෙන්නේ. විභාගය පාස් වුණත් පාස් වෙන්නේ හම්බන්තොටින්. විභාගය පාස් වුණත් පාස් වෙන්නේ රාජපක්ෂ විද්‍යාලයෙන්. විභාගය පාස් වුණත් පාස් වෙන්නේ රාජපක්ෂලා. ආර්ථිකයේ විතරක් නොවෙයි. අධ්‍යාපනයටත් රාජපක්ෂලාට කිරි. අපට කැකිරි වෙලා තිබෙන්නේ. නමුත් බස්නාහිර පළාතේ ජනතාව වෙනුවෙන් අපි කථා කරනවා. ඒ අය වෙනුවෙන් අපි මේ සභාව නියෝජනය කරන්නේ. බොහොම ස්තුතියි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මෙම අවස්ථාවේදී අශෝකා ලංකාතිලක ගරු මන්ත්‍රීතුමිය මූලාසනයේ අසුන් ගන්නවා ඇති.

***ඊට අනුකූලව ගරු සභාපතිතුමා [සුනිල් විජේරත්න මහතා] මූලාසනයෙන් ඉවත් වූයෙන් අශෝකා ලංකාතිලක ගරු මන්ත්‍රීතුමිය මූලාසනාරූඪ විය.***

*Accordingly, Hon. Chairman [Mr. Sunil Wijerathne] left the Chair and Hon. Asoka Lankathilaka M.P.C took the Chair.*

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමිය**
Hon. Presiding Member

මහේෂ් අල්මේදා ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට විනාඩි 07 ක කාලයක් තිබෙනවා.

[ පූ.භා. 11.34 ]

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මේ යෝජනාවට අදහස් ප්‍රකාශ කරන්න අවස්ථාව සලසා දීම පිළිබඳව ඔබතුමියට ස්තුතිවන්ත වෙනවා. අපි දන්නවා, වී.අයි. ලෙනින් වරක් කිව්වා, රටක හොඳම දේ දරුවන්ට කියලා. ඒ කියමනට අනුව රටේ දළ දේශීය නිෂ්පාදනයෙන් 100% ක් අධ්‍යාපනය වෙනුවෙන් වෙන් කරන්න පුළුවන් නම්, ඒකට හිස නමා ආචාර කරන්න, අත් දෙකම උස්සන්න අපට පුළුවන්කම තිබෙනවා. හැබැයි, මේ යෝජනාව එහෙම අදහසකින් ගෙනා යෝජනාවක් නොවන නිසා, ඉතාම කුහක යෝජනාවක් විධියට මේ යෝජනාව ඉදිරිපත් වෙලා තිබෙන නිසා මේ යෝජනාවට කිසිසේත්ම එකඟ වෙන්න බැහැයි කියන කථාව මුලින්ම කියන්න ඕනෑ. අධ්‍යාපන හා උසස් අධ්‍යාපන ක්ෂේත්‍රවල මෑත කාලයේ අර්බුද රැසක් පැන නැඟුනා කියලා මේ යෝජනාවේ මුලින් කියනවා. රටේ ඉහළම බුද්ධිමය සම්පත වන විශ්ව විද්‍යාල ආචාර්ය, මහාචාර්යවරු අඛණ්ඩ වර්ජනයක ඉන්නවා කියලා මේ යෝජනාවේ මුලින් කියනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මේ යෝජනාවේ මේ කාරණය රටේ පිළුණු වුණු මාතෘකාවක්. අපි දන්නවා, මීට බොහෝ කාලයකට කලින් විශ්ව විද්‍යාල ආචාර්යවරු වැඩ වර්ජනයක් කරලා, ඒ අයගේ වැටුප වැඩි කරන්න කියලා උද්ඝෝෂණයක් කරලා, රටේ ඒ පිළිබඳව අවධානය යොමු කරලා, සාකච්ඡා ගිහිල්ලා ඒක දැන් හමාර වෙලා තිබෙන්නේ. ඒ මාතෘකාව ඉවර වෙලා තිබෙන්නේ. නමුත් මේ පිළුණු වුණු මාතෘකාවක් අද දවසේත් ඇදලා ගන්නේ, ඉතාම කුහක දේශපාලන උවමනාවක් ඉෂ්ට කරගන්න කියන කාරණාව තමයි අපට පෙනෙන්න තිබෙන්නේ. අපි දන්නවා අපේ රටේ අද අධ්‍යාපනය වෙනුවෙන් තමයි වැඩිම අයෝජනය කරන්නේ. මේ රටේ දෙමව්පියෝ ලොකුම උනන්දුව ගන්නේ තමන්ගේ දරුවන්ට හොඳ අධ්‍යාපනයක් දෙන්න. ඒ නිසාම අධ්‍යාපන ක්ෂේත්‍රය පිළිබඳව අද රටේ අවධානය, උනන්දුව වැඩි වෙලා තිබෙනවා. ඒ නිසා අද ජනතා විමුක්ති පෙරමුණ දන්නවා. අධ්‍යාපන ක්ෂේත්‍රයේ මිනිස්සුන්ගේ උනන්දුව නිසාම ඒ අධ්‍යාපන ක්ෂේත්‍රය පාවිච්චි කරලා දේශපාලන අර්බුදයක් නිර්මාණය කරලා, තමන්ගේ දේශපාලන මල්ල තර කරගන්න පුළුවන් කියලා ජනතා විමුක්ති පෙරමුණ විශ්වාස කරනවා. ඒ නිසාම තමයි මේ යෝජනාව අද දවසේ මාතෘකාවක් විධියට පළාත් සභාව ඇතුළට ගෙනෙන්නේ. අපි අහනවා. ජනතා විමුක්ති පෙරමුණට සාදාචාරාත්මක අයිතියක් තිබෙනවාද? අධ්‍යාපනයේ අයිතිවාසිකම් ගැන කථා කරන්න. ඔබතුමියට මතක ඇති එතුමාම කිව්වා, අධ්‍යාපනයට දළ දේශීය නිෂ්පාදනයෙන් වැඩිම මුදල් වෙන් කෙරුවේ 1972 කියලා. සමගි පෙරමුණ ආණ්ඩුව තිබුණ කාලයේ. සමගි පෙරමුණ ආණ්ඩුව මතු වුණු මුල්ම කාලයේ තමයි ජනතා විමුක්ති පෙරමුණ තරුණ කැරැල්ලක් නිර්මාණය කරලා, මේ රටේ විශ්ව විද්‍යාල තරුණයන්ව අනාථ කරලා, විනාශ කරලා දැම්මා. වෙන මොනවත් නොවෙයි මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි. පේරාදෙණිය විශ්ව විද්‍යාලය වාගේ ලෝකයේ තිබෙන විශිෂ්ටම විශ්ව විද්‍යාලයක් හදපු සර් අයිවර් ජෙනිංස්ගේ නම වෙනස් කරලා, ඒකට ජනතා විමුක්ති පෙරමුණේ මැරුණු තරුණයෙකුගේ නම දාන්න කියලා ජනතා විමුක්ති පෙරමුණ යෝජනා කළේ. ඒ තරම් කුහක වුණු දේශපාලන පක්ෂයකට, පාසල් ගිනි තියපු දේශපාලන පක්ෂයකට, විදුහල්පතිවරු මරලා දාපු දේශපාලන පක්ෂයකට, පාසල් යන්න තිබෙන අයිතිය නැති කරපු දේශපාලන පක්ෂයකට, විශ්ව විද්‍යාල වහලා දාපු, විශ්ව විද්‍යාලවල මැර බලය නිර්මාණය කරපු දේශපාලන පක්ෂයකට මේ යෝජනාව ඉදිරිපත් කරන්න පුළුවන්, සදාචාරාත්මක අයිතිය තිබෙනවාද කියන ප්‍රශ්නය පැන නඟිනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, විශ්ව විද්‍යාල ආචාර්යවරුන්ගේ ප්‍රශ්නය තමයි ඔවුන් මේ යෝජනාවේ මුලින්ම කථා කරලා තිබෙන්නේ. අපට මතකයි. අතිගරු ජනාධිපතිතුමා මීට සුමාන දෙකකට කලින් උසස් අධ්‍යාපන අමාත්‍යාංශයට ගියා, උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ ප්‍රගතිය පිළිබඳව සමාලෝචනය කරන්න. ඒ ගිය වේලාවේ ජනාධිපතිතුමාට පැහැදිලි වුණා, විශ්ව

විද්‍යාල මහාචාර්යවරු හැටකට අධික සංඛ්‍යාවක් ආණ්ඩුවේ ණය අරගෙන, ආණ්ඩුවේ ණය සහනය අරගෙන උසස් අධ්‍යාපනය සඳහා විදේශගත වෙලා ඉන්නවා කියලා. ණය ගෙවන්නෙත් නැහැ. නැවත රැකියාවට ආපසු රටට එන්නෙත් නැහැ. අතිගරු ජනාධිපතිතුමා උසස් අධ්‍යාපන අමාත්‍යාංශයට ඉතා පැහැදිලිව කිව්වා, ඔවුන්ට ගෙවන්න තිබෙන ණය මුදල කපා හැරලා දාලා ඔවුන්ට මේ රටට එන්න ආරාධනය කරන්න කියලා. මම හිතන්නේ, අධ්‍යාපනය වෙනුවෙන් ඊට වඩා වැඩි දෙයක් කරන්න පුළුවන්ද? ඒ නිසා ආණ්ඩුව එහෙම දේවල් කරද්දී අද විශ්ව විද්‍යාල ආචාර්ය සංගමය අල්ලගෙන, ඒක දේශපාලන උවමනාවන් වෙනුවෙන් මෙහෙයවමින්, විශ්ව විද්‍යාල ආචාර්යවරුන්ගේ සංගමය තමන්ගේ දේශපාලන මතයට ගෙන එමින් දේශපාලන උවමනාවක් නිර්මාණය කරගන්න තමයි ජනතා විමුක්ති පෙරමුණ උත්සාහ කරන්නේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, පසුගිය අවුරුදුවල ආණ්ඩුව විශ්ව විද්‍යාල වෙනුවෙන් වෙන් කරලා තිබෙන මුදල් - 2000 වර්ෂයේදී විශ්ව විද්‍යාල සංවර්ධනය කරන්න රුපියල් මිලියන 500 ක් වෙන් කරනවා. හැබැයි 2005 දී ඒක රුපියල් මිලියන 10200 ක් දක්වා වැඩි කෙරුවා. 2010 දී ඒක රුපියල් මිලියන 19600 ක් දක්වා වැඩි කෙරුවා. 2012 දී රුපියල් මිලියන 25000 ක් දක්වා වැඩි කෙරුවා. මේක ප්‍රමාණවත් මුදලක් නොවෙයි. නමුත් ආණ්ඩුව වැඩි කරන එක දිගින් දිගටම සිද්ධ කරලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ඔබතුමිය දන්නවා ලංකා ඉතිහාසයේ කිසිම රාජ්‍ය සේවකයෙකුට වැඩි කරපු නැති මුදල් ප්‍රමාණයක්, වැටුප් වර්ධක විශ්ව විද්‍යාල ආචාර්යවරුන්ට වැඩි කරන්න කටයුතු කෙරුවා. ජ්‍යෙෂ්ට මහාචාර්යවරයෙකුගේ වැටුප 73% ඉඳලා 83% වනතුරු විශාල මුදලකින් වැඩි කෙරුවා. 73% ක, 83% ක ප්‍රමාණයකින්. සාමාන්‍යයෙන් කථිකාචාර්යවරයෙකුට 36% ක, 39% ක ප්‍රමාණයකින් වැටුප් වැඩි කරනු ලැබුවා. එහෙම විශාල දැවැන්ත වැටුප් වැඩි කිරීම් තුළින් ආණ්ඩුව විශ්ව විද්‍යාල පද්ධතියේ ගුණාත්මක සංවර්ධනයක් ඇති කරන්න උත්සාහ කරලා තිබෙනවා. ඒ වාගේම අපි ඉතා පැහැදිලිව කියන්න ඕනෑ. යුනෙස්කෝ සංවිධානය තමන්ගේ නිර්ණායක ඉදිරිපත් කරන්නේ, අපේ රට ඉලක්ක කරගෙන විතරක් නොවෙයි. ලෝකයේ බොහෝ රටවල අධ්‍යාපනය දැවැන්ත පරිහාණියකට ලක් වෙලා තිබෙන්නේ. ලෝකයේ සංවර්ධනය වෙමින් තිබෙන රටවල්වල අධ්‍යාපනය වෙනුවෙන් වෙන් කරන මුදල ඉතාම අල්ප ප්‍රමාණයක්. ඒ නිසා යුනෙස්කෝව සමස්තයක් විධියට ලෝකයට කිව්වා 6% ක ප්‍රමාණයක් අධ්‍යාපනය වෙනුවෙන් වෙන් කරන්න කියලා. ඒක අපේ රට ඉලක්ක කරගෙන නොවෙයි කිව්වේ. ජනතා විමුක්ති පෙරමුණ හිතනවා. යුනෙස්කෝව ඒ අයගේ නිර්ණායක ඉදිරිපත් කරන්නේ ලංකාව දිහා බලාගෙන කියලා. ඒක ලෝකයේ සියලු රටවල් දිහා බලාගෙන ඉදිරිපත් කරපු නිර්ණායකයක්. ඉතාම අඩු මුදලක් සියයට දශම හයක්, දළ ජාතික නිෂ්පාදනයෙන් අධ්‍යාපනය වෙනුවෙන් වෙන් කරන රටවල් ලෝකයේ තිබෙනවා. සියයට එකයි දශම ගණනක් වෙන් කරන රටවල් ලෝකයේ තිබෙනවා. ඒ රටවල් දිහා බලලා තමයි, අධ්‍යාපනය කඩා වැටුණු රටවල් දිහා බලලා තමයි මේ මුදල වෙන් කරන්න කියලා කිව්වේ. හැබැයි, අපි ඉතා පැහැදිලිව කියන්න ඕනෑ. ලෝකයේ සංවර්ධනය වුණු රටවල්, ඇමරිකාව දළ ජාතික නිෂ්පාදනයෙන් අධ්‍යාපනය සඳහා කොපමණ මුදලක්ද වෙන් කරන්නේ? චීනය කොපමණ මුදලක්ද වෙන් කරන්නේ? අසල්වැසි ඉන්දියාව 4% යි වෙන් කරන්නේ. කියුබාව විතරයි 19% ක් වැනි දැවැන්ත මුදලක් අධ්‍යාපනය වෙනුවෙන් ආයෝජනය කරන්නේ. ලෝකයේ වෙන අනික් රටවල් අධ්‍යාපනය වෙනුවෙන් එහෙම වෙන් කරන්නේ නැහැ. එහෙමනම් අපේ රටට මොකක්ද මේ කරන බල කිරීම. ඒ නිසා මේක දේශපාලන කුහකකමක්. ඒකයි අපට මේ යෝජනාවට එකඟ වෙන්න බැරි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අපි දන්නවා පසුගිය ඉතිහාසය පුරාම සැලකුවාම අපේ රටේ තරම් Literacy rate එක ඉස්සරහාට ගිය රටක් ලෝකයේ වෙන කොහේවත් නැහැ. කියවන්න, ලියන්න හැකියාව තිබෙන මිනිස්සු වැඩිම ප්‍රමාණයක් ඉන්නේ අපේ රටේ. ඒක සංවර්ධනය වෙමින් තිබෙනවා. අපේ රටේ ඉලක්කයක් තිබෙනවා, තව අවුරුදු තුනක් යද්දී රටේ මිනිස්සුන්ගේ කියැවීමේ ලිවීමේ හැකියාව, ඒ ප්‍රතිශතය 100% ක් බවට පත් කරන්න. ඒ නිසා ලංකාව අධ්‍යාපනයේ දැවැන්ත සංවර්ධනයක් ලබලා තිබෙන රටක්. ලංකාව නිදහස් අධ්‍යාපනය එහෙම් පිටින්ම රැකගෙන යන රටක්. අධ්‍යාපනය වෙනුවෙන් දළ දේශීය නිෂ්පාදනයෙන් විශාල මුදල් වෙන් කරන ලෝකයේ රටවල්, අධ්‍යාපනය සඳහා මුදල් අය කරන රටවල්. අසල්වැසි රට වන ඉන්දියාව මුදලට මිස නොමිලේ අධ්‍යාපනය දෙන්නේ නැහැ. චීනයේත් එහෙමයි. චීනයේ අධ්‍යාපනය දෙන්නේ මුදලට. නමුත් ලංකාව නිදහස් අධ්‍යාපනය තවමත් ආරක්ෂා කරන රටක්. මේ රටේ ආණ්ඩුව කවදාවක්වත් කිව්වේ නැහැ, අධ්‍යාපනය පුද්ගලීකරණය කරනවා කියලා. අධ්‍යාපනය පුද්ගලීකරණය කරනවා කියලා කවදා හරි කිව්වාද? මේ රටේ අධ්‍යාපනය නිදහසේ සුභ සාධන විෂයක් විධියකට පවත්වාගෙන යන්න ආණ්ඩුව කටයුතු කරලා තිබෙනවා. ඒ නිසාම පසුගිය ඉතිහාසය පුරාම විශාල සංවර්ධනයක් භෞතික වශයෙන් අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ ලබලා තිබෙනවා. විශ්ව විද්‍යාල පද්ධතිය, පාසල් පද්ධතිය, පාසල්වල යටිතල පහසුකම් - පාරක් හැදුවත් ඒක අධ්‍යාපන සංවර්ධනයට බලපානවා. පාර හදපු නිසා තමයි දරුවෝ අද නගරයට අධ්‍යාපනය සඳහා එන්නේ. ඒ නිසා පාර හදන එක අධ්‍යාපනයේ යටිතල පහසුකමක් විධියට පාවිච්චි කරන්න බැහැයි කියලා කවුරු හරි කියනවා නම්, ඔහු මෝඩයක් විධියට තමයි සලකන්න පුළුවන්කම තිබෙන්නේ.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමිය**
Hon. Presiding Member

ඔබතුමාට තව විනාඩියක් විතරයි තිබෙන්නේ.

**ගරු මහේෂ් අල්මේදා**

Hon. Mahesh Almeda

ඒ නිසා ආණ්ඩුව දැවැන්ත සංවර්ධනයක් කරලා තිබෙනවා. මිනිස්සු සංවර්ධනය වෙලා තිබෙනවා. ඒ නිසා මිනිස්සුන්ට අධ්‍යාපනය වෙනුවෙන් ආයෝජනය කරන්න පුළුවන් හැකියාව, සංවර්ධනය ඇති වෙලා තිබෙනවා. ඒ නිසා පෞද්ගලික අංශයත්, මිනිස්සු පෞද්ගලිකව කරන එකත්, ආණ්ඩුව කරන එකත් සියල්ල සැලකුවාම මේ රටේ අධ්‍යාපනය වෙනුවෙන් දළ දේශීය නිෂ්පාදනයේ සියයට ගණන, 6% කටත් එහා යනවා. එහෙම තිබෙන කොට මේ හදන්නේ දේශපාලන උවමනාවක් නිර්මාණය කරලා - අද පාසල් ගේට්ටුව ළඟ ජනතා විමුක්ති පෙරමුණ පේළි ගැහිලා, රංචු ගැහිලා පෙත්සම් අත්සන් කරනවා. ඉස්කෝලේ ඇතුළේ දරුවන්ට මුදල් අය කරනවා කියලා. අද ආණ්ඩුව චක්‍රලේඛයක් නිකුත් කරලා තිබෙනවා. මේ රටේ ඕනෑ දරුවෙකුට පුළුවන් ග්‍රාම සේවක මහත්මයාගේ සහතිකය අරගෙන ගිහිල්ලා පාසල් සංවර්ධන සමිතියට ගෙවන මුදලිනුත් නිදහස් වෙන්න. එහෙම අයිතියක් ඒ චක්‍රලේඛයේ පැහැදිලිව කියලා තිබෙනවා.

[ ගරු මහේෂ් අල්මේදා ]

එහෙම තිබෙද්දී දේශපාලන වශයෙන් තමන්ගේ මල්ල තර කරගැනීම සඳහා කරන උවමනාවක් මේ. ඒ නිසා මේ රටේ ජනතාවට අපි ආයාචනය කරනවා, නැවත වතාවක් විශ්ව විද්‍යාල වහලා, පාසල් දරුවෝ පාරට ගෙනැල්ලා, පාසල් දරුවෝ පාරේ ගිනි තියලා, පුච්චලා මරලා දාලා මේ රටේ අධ්‍යාපනය විතරක් නොවෙයි. මේ රටේ මිනිස්සුන්වත් විනාශ කරන්න හදන මේ කුමන්ත්‍රණයට අහුවෙන්න එපාය කියන කාරණය මතක් කරමින් මේ යෝජනාවට එකඟ නැහැයි කියන කාරණයත් මතක් කරමින් නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

[ පූ.භා. 11.43 ]

**ගරු රේණුක දුෂ්‍යන්ත පෙරේරා** - ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. Renuka Dushyantha Perera - Chief Government Whip

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ජනතා විමුක්ති පෙරමුණේ නලින්ද ජයතිස්ස ගරු මන්ත්‍රීතුමා මේ යෝජනාව ගෙන ඒමෙන් මම හිතන්නේ එතුමාට නම් කිසිම පරමාර්ථයක් නැහැයි කියලයි. මොකද, එතුමාට ඉහළින් තමන්ගේ පක්ෂයේ න්‍යාය පත්‍රය භාර දීලා, ඒ යෝජනාව සභාවට ඉදිරිපත් කරලා, පක්ෂයට වැලේ වැල් නැතුව ඉන්න මොහොතක, මේ රටේ නිදහස් අධ්‍යාපනය විනාශ කරනවාය කියන සටන් පාඨයක් ගොඩ නැංවීම සඳහා, පක්ෂය විසින් ගෙන යන්නා වූ මතවාදය තහවුරු කිරීම සඳහා පළාත් සභාව පාවිච්චි කිරීමක් තමයි නලින්ද ජයතිස්ස ගරු මන්ත්‍රීතුමා මේ යෝජනාව ගෙන ඒම තුළින් කරන්න උත්සාහ කරන්නේ කියන එකයි මගේ පැහැදිලි කිරීම. විශේෂයෙන්ම අධ්‍යාපන ක්ෂේත්‍රය ගත්තාම මෙතෙක් මේ රටේ කිසිම රජයකට කරන්න බැරි වුණු වියදමක් වර්තමාන රජය අධ්‍යාපනය වෙනුවෙන් දරනවා කියන එක ඕනෑම කෙනෙක් පිළිගන්න කාරණයක්. පාසල්වල භෞතික සම්පත් ගත්තාම - පාසල්වල ගුරුවරු බඳවා ගැනීම. එක්සත් ජාතික පක්ෂය චක්‍රලේඛයක් මගින් රාජ්‍ය සේවය සීමා කරලා, ගුරුවරු බඳවා නොගෙන අධ්‍යාපනය විනාශ කිරීම, අධ්‍යාපනයට අවශ්‍ය කරන ගුරුවරු පවා බඳවා ගැනීම තහනම් කරලා තිබියදී, එක්සත් ජාතික පක්ෂය අධ්‍යාපනයේ විශාල කඩා වැටීමකට පත් කරන්න ක්‍රියා කරද්දී, ඒ සියලුම බාධකයන් ඉවත් කරලා. ගුරුවරුන්ගේ අවශ්‍යතාවය අනුව උපාධිධාරීන්ට පත් වීම් දීලා. මේ අධ්‍යාපන ක්ෂේත්‍රයේ විශාල වෙනසක් ඇති කරලා තිබෙන මොහොතක, ජනතා විමුක්ති පෙරමුණට තමන්ගේ දේශපාලන ව්‍යාපාරය පවත්වාගෙන යන්න අවශ්‍ය සටන් පාඨයක් නොමැතිකම නිසා භාවිතා කරන සටන් පාඨයක් හැටියට, ජාතික දළ දේශීය නිෂ්පාදනයෙන් 6% ක් වැය කළ යුතු කියන එක සටන් පාඨයක් හැටියට පරිවර්තනය කරගන්න උත්සාහ කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මේ 6% නිර්ණායක ඇති කළේ ඇයි? ලෝකයේම අධ්‍යාපනය පිළිබඳව සැලකිල්ල යොමු කළාම මහේෂ් අල්මේදා ගරු මන්ත්‍රීතුමා පැහැදිලි කළා වාගේ බොහෝ රටවල් තමන්ගේ අධ්‍යාපනය සඳහා වැය කරන මුදල ඉතාම අල්ප මට්ටමක තමයි තිබෙන්නේ. ඒ වාගේම ඒ රටවල සාක්ෂරතාවය, අධ්‍යාපන මට්ටම ඉතාම පල්ලෙහා මට්ටමක තියෙන්නේ. ඒ නිසා යුනිසෙෆ් සංවිධානය මේ පිළිබඳව අවධානය යොමු කරලා කථා කළා, මොකක්ද? අපි කරන්නේ කියලා. ඒ නිසා පොදු එකඟතාවයක් ඇති කර ගත්තා. හැම රජයක්ම 6% ක මුදලක් අධ්‍යාපනය වෙනුවෙන් වැය කිරීම සුදුසුයි කියන කාරණය පිළිබඳව පොදු සම්මුතියක්, යෝජනාවක් ඉදිරිපත් වුණා. එහිදී රටක් හැටියට පොදු සම්මුතියකට අපත් එකඟ වුණා. ඒ එකඟ වීම තමයි අද ජනතා විමුක්ති පෙරමුණ සටන් පාඨයක් කරගෙන තිබෙන්නේ. හැබැයි, එය ගෙනාවේ වෙනත් රටවල අධ්‍යාපන මට්ටම ඉහළට ගෙන ඒම සඳහා ගෙනාපු සටන් පාඨයක් වශයෙනි. ඒක අපට වලංගු නැහැ. අද ජනතාවට පාසලට ගියාම පෙනෙනවා, පාසල තුළ සිදු වෙලා තිබෙන විපර්යාසය මොකක්ද? කියලා. ඒ නිසා මේ සටන් පාඨය වලංගු කර ගැනීමට ජනතා විමුක්ති පෙරමුණට මේ දක්වා අවස්ථාව ලැබිලා නැහැ. ඔවුන් උත්සාහ කරනවා, මේ තුළින් වෙනත් ආකාරවලින් පාසල් පද්ධතියට බලපෑමක් කරන්න. මොකක්ද ඒ? අද රට පුරාම ගෙන යනවා පාසල්වල සල්ලි එකතු කරනවා කියලා. ඇත්තටම මේක සංකීර්ණ ප්‍රශ්නයක්. පාසල්වලට සල්ලි එකතු කරන්නේ ඇයි? කාටද මේ චෝදනාව කරන්නේ ? ඇතැම් ස්ථානවල යම් යම් අයථා සිද්ධීන් සිද්ධ වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ඔබතුමියත් පෞද්ගලිකව දන්නවා පාසල්වල දියුණුවත් එක්ක පාසල්වල තරගකාරීත්වයක් ඇති වෙලා තිබෙන බව. ඒ නිසා තරගකාරීත්වය තුළ තමන්ගේ පාසල්වල ක්‍රියාකාරකම් වැඩිදියුණු කරගෙන තිබෙනවා. අද රාජකීය විද්‍යාලයේ සියලුම ක්‍රීඩා පහසුකම් තිබෙනවා. ආනන්ද විද්‍යාලයේ සියලුම පහසුකම් තිබෙනවා. ඒ වාගේම අනෙකුත් පාසලුත් ඒ හා සමානව තරග කිරීමට උත්සාහ ගන්නවා. ඒ නිසා ඒ තරගකාරීත්වය තුළින් තමයි දරුවාගේ අධ්‍යාපනය ඉහළට ගෙන එන්නේ. හැබැයි, ඒ ගෙන ඒමට ඒ පාසල්වලට ආර්ථික ශක්තියක් නැහැ. ශක්තිමත් ආදි ශිෂ්‍ය

සංගම් නැහැ. ඒ නිසා ඒ පාසල්වලට ආධාර ලබා ගත හැකි කොටස්වල ආධාර ඇතුව, ඒ පාසල් පද්ධතියේ යම්කිසි නැඟිටීමක් කරන්න උත්සාහ කරනවා. මෙතැන යම් යම් තැන්වල දූෂණ ක්‍රියා සිද්ධ වෙනවා. ඒක සාධාරණීකරණය කරන්න මම උත්සාහ කරන්නේ නැහැ. හැබැයි සමස්තයක් හැටියට මම ජනතා විමුක්ති පෙරමුණටත් කියනවා. ඒ වාගේම සියලුම මාධ්‍යවලින් ඉල්ලීමක් කරනවා. විදුහල්පති භූමිකාවට දැඩි ලෙස මේ කරන පහර දීම කරුණාකර අප සියලු දෙනාම නවත්වන්න ඕනෑ. මොකද, අපි ප්‍රධාන වශයෙන් විදුහල්පති ඉලක්ක කරලා මේ ගහන්නේ. විදුහල්පතිවරයා දූෂිතයෙක්, දූෂිතයෙක්, හොරෙක්, හොරෙක් කියන ගාණට දරුවා තුළ විදුහල්පතිවරයා කෙරෙහි තිබෙන මේ සමාජ පද්ධතිය කෙරෙහි තිබෙන ඒ ගෞරවය සහමුලින්ම විනාශ වෙනවා.

ඒ නිසා දරුවා පුංචි කාලේ ඉඳලා තමන්ගේ ප්‍රධානියා හොරෙක්, දූෂිතයෙක් කියන මට්ටමේ මානසික තත්ත්වයක් මේ පාසල් පද්ධතිය තුළ අද ගොඩ නැඟෙමින් තිබෙනවා. මේක මහා ඛේදවාචකයක්. ඒ නිසා විදුහල්පති භූමිකාවේ යම් වරදක් කරන විදුහල්පතිවරයෙක් ඉන්නවා නම්, ඔහුට විරුද්ධව ක්‍රියාත්මක විය යුතුයි. සමස්තයක් හැටියට දේශපාලඥයන්ට පොදුවේ හොරා, කොමිස්කාරයා, මංකොල්ලකාරයා කිව්වාට කමක් නැහැ. හැබැයි, මේ අනාගත දරු පරපුර මෙහෙයවන විදුහල්පතිවරයාට මේ විදියට පහර දීම තුළ, පාසල් පද්ධතිය තුළ අර දරුවාට ආදර්ශයක් දිය යුතු, අර දරුවාට මග පෙන්වන තමන්ගේ නායකයා, තමන් ගෞරවනීයත්වයෙන්, පූජනීයත්වයෙන් සලකපු විදුහල්පතිවරයාට හොරෙක්, දූෂිතයෙක්, වංචාකාරයෙක්, බොරුකාරයෙක් කියලා මේ ජනතා විමුක්ති පෙරමුණ කරනු ලබන මේ පහර දීම තුළ මේ සමාජ පද්ධතිය මහා බිඳ වැටීමකට, මහා ඛේදවාචකයකට ඇද වැටීමකට ගෙන යන්නේ. ඒ නිසා තමන්ගේ පෞද්ගලික පටු දේශපාලන අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා මේ දරුවන්ගේ අනාගතය පාවා දෙන්න එපැයි කියන කාරණය මම ජනතා විමුක්ති පෙරමුණේ ගරු මන්ත්‍රීතුමාගෙන් කරුණාවෙන් ඉල්ලා සිටිනවා. මෙතුමාත් මේ නිදහස් අධ්‍යාපනයෙන් බිහි වුණු පුද්ගලයෙක්. මේ රජය, අතිගරු ජනාධිපතිතුමා ඇතුළු මුළු රජයක් හැටියට අපි සියලුම දෙනා වගකීමක් ඇතුව නිදහස් අධ්‍යාපනය පිළිබඳව පැහැදිලි සහතිකයක් දීලා තිබෙනවා. නිදහස් අධ්‍යාපනයට කොයි යම් ආකාරයක හෝ හානියක් සිද්ධ කරන්නේ නැහැයි කියන කාරණය. එහෙම කියලා තියෙද්දී තමන්ගේ බංකොලොත් දේශපාලන ව්‍යාපාරයන් ගොඩ නංවා ගැනීම සඳහා මෙවැනි පහත් උත්සාහයන් ගැනීම පිළිබඳව අපි දැඩි සේ කනගාටු වෙනවා. ඒ නිසා -

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Felician De Silva

6% ක් ඕනෑ නැද්ද?

**ගරු රේණුක දුෂ්‍යන්ත පෙරේරා -** ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. Renuka Dushyantha Perera - Chief Government Whip

නැහැ, 6% නොවෙයි. අපට පුළුවන් නම් 15% ක් වෙන් කරමු. ඒක කරන්න ඕනෑ. අපි ඒක නොවෙයි මේ කියන්නේ. මේ කාරණය නොවෙයි, ජනතා විමුක්ති පෙරමුණ කියන්නේ. මේ අය හැමදාම කළේ තමන්ගේ බංකොලොත් දේශපාලන ව්‍යාපාරය ගොඩ නැංවීමයි. උතුරේ යුද්ධය තියෙන කල් මේ රටේ සාමය ගොඩ නංවන්න එපැයි කියන මතවාදයක් ජාතිවාදී පදනමින් ජනතා විමුක්ති පෙරමුණ ගොඩ නැගුවා. අවසානයේ මොකද වුණේ? යුද්ධය ක්‍රියාත්මක කරලා යුද්ධය ජයග්‍රහණය කළාම අද ගිහිල්ලා L.T.T.E එකේ ත්‍රස්තවාදීන් වෙනුවෙන් උතුරේ කිඹුල් කඳුළු හෙලනවා. එදා L.T.T.E එක මර්දනය කළ යුතුයි L.T.T.E එක සමූල ඝාතනය කළ යුතුයි කියපු ජනතා විමුක්ති පෙරමුණ අද ලෝක සංවිධානවලට ගිහිල්ලා උතුරේ තරුණයන් ගැන මානව හිමිකම් ගැන කථා කරනවා. මෙන්න මේක තමයි තත්ත්වය. විශ්ව විද්‍යාල පද්ධතියේත් මේකම නේ? විශ්ව විද්‍යාල පද්ධතිය තුළ ආචාර්යවරුන්ගේ වැටුප් ප්‍රශ්නයක් තිබුණා. ඒක අපි කවුරුවත් නැහැයි කිව්වේ නැහැ. හැබැයි, ඒකට මුවා වෙලා ඔවුන්ගේ පක්ෂය කඩාගෙන ගිහිල්ලා පෙරටුගාමී සංවිධානය බිහි වුණාට පස්සේ විශ්ව විද්‍යාල පද්ධතියේ ජනතා විමුක්ති පෙරමුණට තිබුණු බලය සම්පූර්ණයෙන් ගිලිහී ගියා. උදුල් ප්‍රේමරත්න පෙරටුගාමී සංවිධානයට ගියේ ශිෂ්‍ය ව්‍යාපාරය අරගෙන. ඒ නිසා ජනතා විමුක්ති පෙරමුණට අද ශිෂ්‍ය ව්‍යාපාරයේ බලයක් නැහැ. ඒ නිසා -

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමිය**
Hon. Presiding Member

ඔබතුමාට තව විනාඩියක කාලයක් තිබෙනවා.

**ගරු රේණුක දුෂ්‍යන්ත පෙරේරා -** ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. Renuka Dushyantha Perera - Chief Government Whip

ඒ බලය ගොඩ නංවා ගැනීම සඳහා ඔවුන්ට දේශපාලන මතවාදයක් මේ පද්ධතිය තුළ ඇති කළ යුතුයි. අන්න ඒ නිසා ජනතා විමුක්ති පෙරමුණ සරල භාෂාවෙන් කිව්වොත් කුපාඩි දේශපාලන සංස්කෘතිය මේ අධ්‍යාපන ක්ෂේත්‍රයට ගෙනැල්ලා තිබෙනවා. මේක මහ ඛේදවාචකයක්. මේක මුල්ම අවදියේ විනාශ කළ යුතුයි. එහෙම නොවුණොත් ජනතා විමුක්ති පෙරමුණ ඔවුන්ගේ අවශ්‍යතාවය සඳහා මේ රටේ අනාගත දරු පරපුර විනාශය කරා ගෙන යන්නේ. මොකද, ත්‍රස්තවාදය සඳහා තරුණයින් ගත හැකි වන්නේ, නූගතුන් ඉන්න සමාජයකිනි. ඒ නිසා නූගතුන් ඇති කිරීම සඳහා පාසලේ ප්‍රධානියා වන විදුහල්පති භූමිකාවට දැඩි සේ පහර දීලා, විදුහල්පතිවරයාගේ ආත්ම ගෞරවය කෙළෙසා දමලා, දරුවන්ට විදුහල්පතිවරයා කෙරෙහි වෛරයක් ඇති කරලා, දරුවාට අධ්‍යාපනය පිළිබඳව තිබෙන්නා වූ බරපතළ විශ්වසනීයත්වය බිඳ දාලා, දරුවාගේ අධ්‍යාපනය විනාශ කිරීමේ පටු පර්මාර්ථයකින් යුක්තව නිදහස් අධ්‍යාපනයෙන් බිහි වෙලා, නිදහසේ ලබපු නිදහස් අධ්‍යාපනය විනාශ කරන්න නලින්ද ජයතිස්ස වාගේ තරුණ මන්ත්‍රීවරයෙක්

පාව්ච්චි කරන ජනතා විමුක්ති පෙරමුණට ශාප වේවායි කියමින් මම නිහඬ වෙනවා.

[ පූ.භා. 11.54]

**ගරු නලින්ද ජයතිස්ස**
Hon. Nalinda Jayathissa

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අධ්‍යාපනයට 6% ක් නොවෙයි, පසුගිය අවුරුදු 30 ක ඉතිහාසයේ 2.5% ක් වත් වෙන් නොකරපු එකේ ප්‍රතිඵලය මේ කථා බහෙන් තේරුම් ගත්තා. මම කල්පනා කළා, රේණුක පෙරේරා ආණ්ඩු පක්ෂයේ ගරු ප්‍රධාන සංවිධායකතුමා කථා කළේ මම ඉදිරිපත් කරපු යෝජනාව ගැනද කියලා. පොදුවේ ආණ්ඩුවෙන් කථා කළ මන්ත්‍රීවරු හැම කෙනෙක්ම ප්‍රකාශයට පත් කළේ, මේ යෝජනාව දේශපාලන වශයෙන් කුහක ලෙස ඉදිරිපත් කරපු යෝජනාවක්ය කියලා. දැන් උත්තර දෙන්න වෙලාවක් නැහැ. නමුත් මම ආයේ ආයේත් පෙරළ පෙරළා බලනවා කොහේද මේ යෝජනාවේ එහෙම කුහකකමක් තිබෙන්නේ කියලා. බොහොම පැහැදිලිව මේ යෝජනාව,

[ ගරු නලින්ද ජයතිස්ස ]

මේ රටේ ලක්ෂ 40 ක් වන පාසල් දරුවෝ වෙනුවෙන්, මේ රටේ 80,000 ක් වන විශ්ව විද්‍යාල ශිෂ්‍යයෝ වෙනුවෙන්, රටේ අනාගත පරම්පාරව වෙනුවෙන් අවම වශයෙන් 6% ක් අධ්‍යාපනයට වෙන් කරන්න කියලා ඉදිරිපත් කරපු යෝජනාවක්. මේකට ආණ්ඩුවට විරුද්ධ වෙන්න කිසිම සදාචාරාත්මක අයිතියක් නැහැ. හැබැයි ආණ්ඩු පක්ෂයේ සංවිධායකතුමා ආණ්ඩු පක්ෂයේ සමස්ත අදහස තමයි කිව්වේ. දිගටම ජනතා විමුක්ති පෙරමුණට මඩ ගැහුවා මිසක්කා, ජනතා විමුක්ති පෙරමුණට දෝෂාරෝපණ එල්ල කළා මිසක්කා මේ යෝජනාවේ තිබෙන හරය ගත්තේ නැහැ. ඕක තමයි මේ අධ්‍යාපනයට මතු වෙලා තිබෙන ඛේදවාචකය. ඒ විතරක් නොවෙයි. දැන් මේ දූෂිත විදුහල්පතිවරු ගැන කථා කළා. ඇත්ත. සමහර විදුහල්පතිවරු පගා ගන්නවා. හැබැයි, මේ යෝජනාවේ තිබෙන්නේ එහෙම කරුණක් ගැන නොවෙයි. විදුහල්පතිවරු එතැනට පත් කරලා තිබෙන්නේ ඇයි? පගාව ගන්න විදුහල්පතිවරු, අල්ලස් ගන්න විදුහල්පතිවරු ඒ තත්ත්වයට පත් කරලා තිබෙන්නේ මේ සමාජ ක්‍රමයෙන්. ඒ විතරක් නොවෙයි. බොහෝ විදුහල්පතිවරුන්ට පාසලක් ගානේ මුදල් එකතු කරන්න වෙලා තිබෙන්නේ මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ආණ්ඩුව මුදල් ප්‍රතිපාදන වෙන් කරන්නේ නැති නිසා. මම පුදුමයට පත් වෙනවා. යසපාල කෝරළගේ වාගේ මන්ත්‍රීවරයෙක් අහනවා, මොකටද 6% ක් කියලා. කොහේද අවශ්‍යතාවය කියලා. ඉන්නේ කොහේද කියලා දන්නේ නැහැ. අනේ පොඩ්ඩක් කිලෝ මීටර් දෙකක් එහාට ගිහිල්ලා බැලුවා නම් එහෙම. අර දොන් පේද්‍රික් ඉස්කෝලේ ඇයි සල්ලි එකතු කරන්නේ කියලා හොයලා බැලුවා නම් එහෙම අවශ්‍යතාවය තේරෙයි. අඩු ගාණේ මේ මන්ත්‍රීවරුන්ට දළ දේශීය නිෂ්පාදිතය කියන්නේ මොකක්ද කියලා තේරෙන්නේ නැහැ. දළ දේශීය නිෂ්පාදිතය කියන්නේ මොකක්ද කියලා දන්නේ නැහැ. කෙනෙක් අහනවා ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයෙන් වෙන් කරන ඒවා දළ දේශීය නිෂ්පාදිතයට අයිති නැද්ද කියලා. දළ දේශීය නිෂ්පාදිතයට මේ රටේ වෙන් කරන සියල්ල අයිතියි. ජනාධිපතිතුමා පාර්ලිමේන්තුවේදී මොකක්ද කිව්වේ? ඔබතුමන්ලාගේ -

**ගරු රේණුක දුෂ්‍යන්ත පෙරේරා - ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක**
Hon. Renuka Dushyantha Perera - Chief Government Whip

එහෙම කිව්වේ නැහැ. වැරදි අර්ථකථන දෙන්න එපා.

**ගරු නලින්ද ජයතිස්ස**
Hon. Nalinda Jayathissa

ඉන්නකෝ කියන්න. ඔය කථාවල වැරදි අර්ථකථන කොච්චර තිබුණාද? මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ජනාධිපතිතුමා අයවැය ඉදිරිපත් කරනකොට එතුමා ඉදිරිපත් කරනවා වෘත්තීය හා නිපුණතා සංවර්ධන වියදම් මෙපමණයි.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමිය**
Hon. Presiding Member

ඔබතුමාට තව විනාඩියක් පමණයි.

**ගරු නලින්ද ජයතිස්ස**
Hon. Nalinda Jayathissa

අනෙකුත් අමාත්‍යාංශ යටතේ වන අධ්‍යාපන වියදම් 2013 ට බිලියන 14 ක් ය කියනවා. ඒ ඔක්කොම එකතු කරලා තමයි 1.49% හදා ගත්තේ. ඒකත් එකතු කරලයි හදා ගත්තේ. ඒ නිසා බොහොම පැහැදිලියි. දැන් මේකේ ජනතා විමුක්ති පෙරමුණ 6% ක් ඉල්ලනවා නොවෙයි. විශේෂයෙන් දැන් ලෙනින්ගෙන් පටන් අරගෙන ලොරෙන්සෝ ද අල්මේදාගෙන් කෙළවර කරපු මහේෂ් අල්මේදා මැතිතුමා කියනවා නේ මේ යෝජනාව පිළුණු වුණු යෝජනාවක්, වැඩක් නැතය කියලා. ඔබතුමා ගිහිල්ලා පොත් පෙරළලා බලන්න. ඔබතුමාගේ ඇමැති ඉන්දික ගුණවර්ධන මැතිතුමා උසස් අධ්‍යාපන ඇමැති ඉන්න කාලේ එතුමාත් ගිහිල්ලා මේකට අත්සන් කළා. ගියපු වෙලාවක ඕනෑ නම් පොඩ්ඩක් කණට කරලා අහලා බලන්න ඉන්දික ගුණවර්ධනගෙන්. එහෙම අත්සන් කරපු පක්ෂයක මිනිස්සු අද මෙහෙම කථා කරන්නේ. ඒ නිසා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි -

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමිය**
Hon. Presiding Member

ඔබතුමාගේ කාලය අවසන්.

**ගරු නලින්ද ජයතිස්ස**
Hon. Nalinda Jayathissa

මේ රටේ මේ වෙලාවේ මූලික අවශ්‍යතාවයක් තමයි අවම වශයෙන් දළ දේශීය නිෂ්පාදිතයෙන් 6% ක් වෙන් කරන එක.

සුගත් මතුගමගේ ගරු මන්ත්‍රීතුමා කිව්වා නේ මේක එක පාරට වෙන් කරන්න බැරිය කියලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, එක පාරට වෙන් කරන්න කවුරුත් ඉල්ලුවේ නැහැ. අඩු තරමේ අපට පේන්න ඕනෑ Signal එකත් යන්නේ ඒ පැත්තට කියලා. ඒ නිසා අපට බොහොම පැහැදිලියි.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමිය**
Hon. Presiding Member

ඔබතුමාගේ කාලය අවසන්.

**ගරු නලින්ද ජයතිස්ස**
Hon. Nalinda Jayathissa

අධ්‍යාපනයට 6% ක් කියන යෝජනාව ආණ්ඩුවට නයාට අඳු කොළ වාගේ තමයි. ඒ අයට ඕනෑ රටේ ජනතාවට අධ්‍යාපනය දෙන්න නොවෙයි. නුගත් පරපුරක්, රාජපක්ෂ පවුලේ දරුවන්ට විතරක් අධ්‍යාපනය සීමා කරලා, රටේ බහුතරයකගේ දරුවන්ගේ අධ්‍යාපන අයිතිය කපන්නයි යන්නේ. ඒකට අපි විරුද්ධයි. ඒ නිසා මේ 6% යෝජනාව මේ පළාත් සභාවේ සම්මත වුණේ නැතත් ඒ වෙනුවෙන් මේ රටේ ජනතාව ඉස්සරහාට ගිහිල්ලා මේක ජනතාවගේ යෝජනාවක් බවට අපි පත් කරනවා. ඒ වෙනුවෙන් මේ වෙලාවේ පක්ෂ විපක්ෂව අදහස් දැක් වූ සියලු මන්ත්‍රීවරුන්ට ස්තුති කරමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමිය**
Hon. Presiding Member

මේ අවස්ථාවේදී ගරු සභාපතිතුමා මූලාසනයේ අසුන් ගන්නවා ඇති.

***ඊට අනුකූලව මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමිය [අශෝකා ලංකාතිලක මෙනෙවිය] මූලාසනයෙන් ඉවත් වූයෙන් ගරු සභාපතිතුමා [සුනිල් විජේරත්න මහතා ] මූලාසනාරූඪ විය.***

*Accordingly Hon. Presiding Member [Miss Asoka Lankathilaka] left the Chair and Hon. Chairman [Mr. Sunil Wijeratne] took the Chair.*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

නලින්ද ජයතිස්ස ගරු මන්ත්‍රීතුමා විසින් ඉදිරිපත් කළ යෝජනාව පිළිබඳ විවාදය අවසන් වෙනවා. එම යෝජනාව පිළිබඳව සභාවේ බෙදීමක් තිබෙනවාද?

**ගරු රේණුක දුෂ්‍යාන්ත පෙරේරා –** ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. Renuka Dushyantha Perera - Chief Government Whip

ගරු සභාපතිතුමනි, බෙදීමක් තිබෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකර සීනුව නාද කරන්න.

***ප්‍රශ්නය විමසන ලදින් 61 (3) රීතිය යටතේ පළාත් සභාව පක්ෂව 11 යි, විරුද්ධව 31 යි, වැළකුණු 00 යි යනුවෙන් බෙදුණේය.***

*Question put and the Council divided as per Rule No 61 (3), 11 for, 31 against and 00 decliners.*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

න්‍යාය පත්‍රයේ අංක 02 යටතේ සුගත් මතුගමගේ ගරු මන්ත්‍රීතුමාගේ නමින් යුත් යෝජනාව ඉදිරිපත් කිරීමට ගරු මන්ත්‍රීතුමාට අවස්ථාව.

**ගරු සුගත් මතුගමගේ**
Hon. Sugath Mathugamage

ගරු සභාපතිතුමනි, මට මේ සම්බන්ධයෙන් විශේෂ පැහැදිලි කිරීමක් අවශ්‍යයි. මේ යොජනාව මවිසින් ඉදිරිපත් කොට සැලකිය යුතු කාලයක් වුණා. රටේ පවතින දේශපාලන තත්ත්වයන් සමග එයට සමගාමීව මා විසින් මේ යෝජනාව ඉදිරිපත් කරනු ලැබුවත්, කවර හෝ හේතූන් මත මම දකින විධියට බෙදුම්වාදයට පක්ෂපාත වන සමහර කුඨ බලවේග විසින් සැලසුම් සහගතව මේ යෝජනාව ගෙන ඒම කල් දමනු ලබලා තිබෙනවා. ඒ නිසා ගරු සභාපතිතුමනි, බොහොම පැහැදිලිවම මේ යෝජනාව ආණ්ඩු පක්ෂයේ කණ්ඩායම් රැස්වීමේදී කථා කළ පරිදි අද දින සාකච්ඡාවට නොගන්නා බවටත්, මේ සම්බන්ධයෙන් කාලය වෙන් කිරීමක්වත් කිසිදු මන්ත්‍රීවරයෙක් දැනුවත් කිරීමක්වත් වුණේ නැහැ. ඒ නිසා මම තරයේ විශ්වාස කරනවා පැහැදිලිවම මෙය බෙදුම්වාදයට පක්ෂපාතී, කිසියම් අන්තවාදියෙකුගේ කුමන්ත්‍රණයක් බව. ඒ නිසා මම මේ යෝජනාව න්‍යාය පත්‍රයෙන් ඉවත් කර ගන්නවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එතුමා යෝජනාව ඉවත් කර ගත් නිසා යෝජනාව න්‍යාය පත්‍රයෙන් ඉවත් වෙනවා.

***ඊට අනුකූලව පෞද්ගලික මන්ත්‍රී යෝජනාව න්‍යාය පත්‍රයෙන් ඉවත් වේ.***

*Accordingly the Private Member Motion get removed from the Agenda*

**ගරු යූ. ජෝර් පෙරේරා –** විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරයෙක් විසින් යෝජනාව ඉදිරිපත් කරලා ආණ්ඩු පක්ෂයෙන්ම ඉවත් කර ගන්නවා.

**ගරු මංජු ශ්‍රී අරංගල –** විපක්ෂ නායකතුමා
Hon. Manju Sri Arangala - Leader of the Opposition

ආණ්ඩු පක්ෂයේ තත්ත්වය පැහැදිලියි.

[සභාවේ ඝෝෂා]

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

අධිරාජ්‍යවාදී කුමන්ත්‍රණ.

**ගරු මංජු ශ්‍රී අරංගල –** විපක්ෂ නායකතුමා
Hon. Manju Sri Arangala - Leader of the Opposition

තමන්ගේ මන්ත්‍රීවරුන්ගේ –

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකරලා වාඩි වෙන්න.

**ගරු නලින්ද ජයතිස්ස**
Hon. Nalinda Jayathissa

ගරු සභාපතිතුමනි, ජිනීවා ඩීල් එක ගහලා තියෙන්නේ. ඕක තමයි ඩීල් එක.

**ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Felician De Silva

ගරු සභාපතිතුමනි, වරප්‍රසාද ප්‍රශ්නයක්.

[සභාවේ ඝෝෂා]

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

සභාව කල් තැබීමේ යෝජනාව ඉදිරිපත් කිරීමට ගරු සභානායකතුමාට අවස්ථාව.

[සභාවේ ඝෝෂා]

# කල් තැබීමේ යෝජනාව
## ADJOURNMENT

**ගරු සුනිල් ජයමිණි –** සභානායකතුමා
Hon. Hon. Sunil Jayamini - Leader of the House

ගරු සභාපතිතුමනි, *"දැන් මෙම සභාව කල් තැබිය යුතු යැයි"* යෝජනා කරනවා.

***ඊට අනුකූලව පළාත් සභාව අ.භා. 12.06 ට, 2013 අප්‍රේල් මස 09 වන දින පූ.භා. 9.30 වන තෙක් කල් ගියේය.***

*Sitting, accordingly adjourned at12.06 p.m till 9.30 a.m. on 09.04.2013*